# කාඩ්පත් සාමාජිකයාගේ ගිවිසුම

වැදගත්: ඔබ නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී වෙතින් ලබා දී ඇති මෙහි අන්තර්ගත කාඩ්පත අත්සන් කිරීමට හෝ භාවිතා කිරීමට පෙර, කරුණාකර මෙම කාඩ්පත් සාමාජිකයාගේ ගිවිසුම හොඳින් කියවන්න.

කාඩ්පත භාරගැනීමෙන් සහ/හෝ අත්සන් කිරීමෙන් සහ/හෝ භාවිත කිරීමෙන්, ඔබ පහත දක්වා ඇති නියමයන් සහ කොන්දේසි පිළිගැනීමට සහ ඒවාට බැඳී සිටීමට එකඟ වේ.

## 1. අර්ථ නිරූපන:

බැංකුව - යන්නෙන්, නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී එහි අනුප්‍රාප්තිකයින් සහ පැවරුම්ලාභීන් අදහස් වේ.

මූලික කාඩ්පත් සාමාජිකයා - යන්නෙන් බැංකුව විසින් නමට කාඩ්පත් ගිණුමක් විවෘත කර ඇති හෝ විවෘත කිරීමට තීරණය කර ඇති පුද්ගලයකු අදහස් වේ.

කාඩ්පත - යන්නෙන් ඇමරිකන් එක්ස්ප්‍රස් ගෝල්ඩ්, ග්‍රීන්, බ්ලූ හෝ බැංකුව විසින් නිකුත් කරන ලද වෙනත් ඇමරිකන් එක්ස්ප්‍රස් සන්නාමගත ණයවර කාඩ්පත අදහස් වේ.

කාඩ්පත් ගිණුම - යන්නෙන් මෙම ගිවිසුම යටතේ මූලික කාඩ්පත් සාමාජිකයා සහ අතිරේක කාඩ්පත් සාමාජිකයා (සාමාජිකයන්) සිටී නම් ඔවුන් විසින් ලද හෝ දරන ලද සියලුම බැර සහ හර ඇතුළත් කිරීම සඳහා බැංකුව විසින් විවෘත කරන ලද ගිණුම අදහස් වේ.

මුදල් අත්තිකාරම් - යන්නෙන් කාඩ්පත, කාඩ්පත් අංකය හෝ පෞද්ගලික හදුනාගැනීමේ අංකය (PIN) භාවිතයෙන් මුදල් ලබා ගැනීමේ ක්‍රියාවලියක් අදහස් වේ.

මුදල් අත්තිකාරම් සීමාව - යන්නෙන් මුදල් අත්තිකාරම් සඳහා බැංකුව විසින් අවසර දී ඇති උපරිම සීමාව අදහස් වේ.

ගාස්තුව හෝ ගනුදෙනුව - යන්නෙන් අය කරන ලද අදාළ ගාස්තු සහ කාඩ්පත් සාමාජිකයා බැංකුවට ගෙවීමට එකඟ වූ/එකඟ වී ඇති හෝ මෙම ගිවිසුම යටතේ වගකීමට එකඟ වූ/එකඟ වී ඇති අනෙකුත් සියලුම මුදල් ඇතුළුව කාඩ්පත සමඟ සිදු කරන ලද හෝ අය කරන ලද ඕනෑම ගනුදෙනුවක් අදහස් වේ.

ණය සීමාව -යන්නෙන් කාඩ්පත් ගිණුම මත බැංකුව විසින් අවසර දී ඇති උපරිම හිඟව තිබෙන හර ශේෂය අදහස් වේ.

වර්තමාන ශේෂය - යන්නෙන් නිශ්චිත දිනයකදී කාඩ්පත් ගිණුමේ හිඟ මුළු මුදල අදහස් වේ.

ගෙවිය යුතු අවම ගෙවීම - යන්නෙන් ගෙවීම් නියමිත දිනට ගෙවිය යුතු අවම මුදල ලෙස ප්‍රකාශයේ දක්වා ඇති මුදල අදහස් වේ.

විදේශ ගනුදෙනු - යන්නෙන් විදේශයන්හි සිදු කරන ලද ගනුදෙනු අදහස් වේ.

පසුගිය ගෙවිය යුතු මුදල- පෙර ප්‍රකාශයෙන් / ප්‍රකාශවල සිට හිඟව ඇති සමුච්චිත අවම ගෙවීම් වේ (ඇත්නම්). ඕනෑම පසුගිය ගෙවිය යුතු මුදලක් ප්‍රකාශයේ වෙනම දක්වා ඇති අතර එය වහාම ගෙවිය යුතුය.

ගෙවිය යුතු දිනය - යන්නෙන් මුළු හිඟ මුදල් හෝ එහි යම් කොටසක් හෝ ගෙවිය යුතු අවම මුදල බැංකුව වෙත ගෙවිය යුතු දිනය ලෙස ප්‍රකාශයේ නිශ්චිතව දක්වා ඇති දිනය අදහස් වේ.

පින් (PIN) - යන්නෙන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) හරහා කාඩ්පත සමඟ භාවිතා කිරීම සඳහා බැංකුව විසින් ලබා දී ඇති හෝ කාඩ්පත් සාමාජිකයා විසින් තෝරා ගන්නා ලද පුද්ගලික හඳුනාගැනීමේ අංකය අදහස් වේ.

පසු දිනය - යන්නෙන් අදහස් වනුයේ ගනුදෙනුවක් සකස් කර කාඩ්පත් ගිණුමට පියවන දිනයයි.

සේවා ආයතන - භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා කාඩ්පත පිළිගනු ලබන හෝ ගෙවීම් උපකරණයක් ලෙස කාඩ්පත පිළිගැනීමට කැමති ඕනෑම ස්ථානයක පිහිටි ආයතන යන්නයි.

ප්‍රකාශය - යන්නෙන් කාඩ්පත් ගිණුම හා සම්බන්ධව මූලික කාඩ්පත් සාමාජිකයාගේ හා ඕනෑම අතිරේක කාඩ්පත් සාමාජිකයෙකුගේ ( සාමාජිකයන්ගේ) එම දිනයට මූල්‍ය වගකීම් සඳහන් කරමින් බැංකුව විසින් මූලික කාඩ්පත් සාමාජිකයා වෙත යවන ලද මාසික ගිණුම් ප්‍රකාශයක් හෝ වෙනත් ආවර්තක ගිණුම් ප්‍රකාශයක් අදහස් කෙරේ.

අතිරේක කාඩ්පත් සාමාජිකයා - යන්නෙන් මූලික කාඩ්පත් සාමාජිකයාගේ ඉල්ලීම මත කාඩ්පතක් නිකුත් කරනු ලබන සහ මූලික කාඩ්පත් සාමාජිකයාගේ කාඩ්පත් ගිණුමට ගාස්තු අය කළ හැකි මූලික කාඩ්පත් සාමාජිකයා හැර වෙනත් පුද්ගලයෙකු අදහස් වේ.

ටී-පින් (T-PIN) - යන්නෙන් අදහස් වන්නේ බැංකුව විසින් ලබා දී ඇති දුරකථන පුද්ගලික හැඳුනුම් අංකය හෝ කාඩ්පත් සාමාජිකයා විසින් දුරකථනය හරහා බැංකුව සමඟ හඳුනාගැනීමේ අරමුණු සඳහා තෝරා ගන්නා ලද අංකයයි. බැංකුවේ අභිමතය පරිදි මෙම පහසුකම ලබා දෙනු ඇත.

තෙවන පාර්ශ්වීය සේවා සපයන්නා - යන්නෙන් කාඩ්පත හරහා ප්‍රතිලාභ සහ/හෝ සේවා ව්‍යාප්ත කිරීම සඳහා බැංකුව සම්බන්ධ විය හැකි තෙවන පාර්ශවයක් අදහස් වේ.

ගෙවිය යුතු මුළු අවම ගෙවීම් - ගෙවිය යුතු අවම ගෙවීම් සහ පසුගිය ගෙවිය යුතු මුළු එකතුවයි. මෙය ප්‍රකාශයේ වෙන වෙනම දක්වා ඇත.

මුළු හිඟ මුදල - යන්නෙන් ප්‍රකාශය නිකුත් කරන දිනයේ බැංකුවේ වාර්තා අනුව බැංකුවට ගෙවිය යුතු කාඩ්පත් ගිණුමේ හිඟ මුළු හර ශේෂය (කාඩ් ගිණුමට හර කළ යුතු සියලුම ගාස්තු ඇතුළුව) අදහස් වේ.

ගනුදෙනු දිනය - කාඩ්පත් සාමාජිකයෙකු සහ සේවා ආයතනයක් අතර ගනුදෙනුවක් සිදු වන දිනය අදහස් වේ.

මූලික කාඩ්පත් සාමාජිකයා සහ අතිරේක කාඩ්පත් සාමාජිකයා තනි තනිව " කාඩ්පත් සාමාජිකයා " සහ ඒකාබද්ධව " කාඩ්පත් සාමාජිකයන්" ලෙස හඳුන්වනු ලැබේ.

## 2. නියමයන් සහ කොන්දේසි අදාළත්වය සහ ව්‍යවස්ථාපිත අනුකූලතාවය:

2.1 කාඩ්පත හෝ කාඩ්පත් ගිණුම පදනම් කර හෝ ඊට අදාළව ඕනෑම පුද්ගලයෙකුට බැංකුව විසින් ලබා දී ඇති සියලුම පහසුකම් කලින් කලට සංශෝධනය කළ හැකි පරිදි, මෙම ගිවිසුමේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසිවලට සහ බලාත්මක වන වෙනත් ඕනෑම වැඩසටහනක අඩංගු නියමයන් සහ කොන්දේසි සහ නියමයන්ට යටත් වේ. කාඩ්පත් සාමාජිකයා කාඩ්පත සඳහා වන අයදුම්පත්‍රයේ ඔහුගේ/ඇයගේ අත්සන තැබීමෙන් සහ/හෝ ඔහුගේ/ඇයගේ අත්සන කාඩ්පතෙහි තැබීමෙන් සහ/හෝ භාවිත කිරීමෙන් (අදාළ වන පරිදි) කාඩ්පත් හිමියා විසින් එම කොන්දේසි හා නියමයන් පිළිගත් බවට සාක්ෂි දරයි.

2.2 කාඩ්පත භාවිත කිරීමේ දී ශ්‍රී ලංකාවේ සියලුම නීතිවලට අදාළවද විනිමය පාලන නියෝග වලට අදාළවද සහ කලින් කල සංශෝධනය කරනු ලබන ප්‍රතිපත්ති හා නියෝග වලටද තදින්ම අනුකූලව ක්‍රියා කළ යුතු ය.

2.3 කාඩ්පත් සාමාජිකයා විසින් වාණිජ ප්‍රමාණවලින් භාණ්ඩ මිලදී ගැනීමට/ආනයනය කිරීමට හෝ ප්‍රාග්ධන ගනුදෙනුවලට කාඩ්පත (කාඩ්පත්) භාවිත නොකළ යුතු ය.

2.4 කාඩ්පත භාවිත කිරීම මගින් විද්‍යුත් මුදල් මාරුකිරීමක් සිදු කිරීමට හෝ ඒ.ටී.එම් හරහා විදේශීය ව්‍යවහාර මුදල් ආපසු ලබා ගැනීමට අවශ්‍ය වුවහොත් එම ගනුදෙනුව විදේශ විනිමය පාලන දෙපාර්තුමේන්තුව විසින් කලින් කල නිකුත් කරනු ලබන නියෝගවලට යටත්වන අතර එය බලයලත් කාර්ය සඳහා පමණි.

2.5 විනිමය පාලක විසින් සහ / හෝ වෙනත් පාලන අධිකාරියක් විසින් කලින් කල නියම කරනු ලබන නියමයන්ට බැංකුව අනුකූලව ක්‍රියා කළ යුතු අතර ඒ අනුව ක්‍රියා කරමින් බැංකුව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති සහ නියෝග යටතේ ගනුදෙනු පිළිබඳ තොරතුරු අදාළ බලධාරීන්ට සපයනු ලැබිය යුතු ය.

2.6 තත් කාලයේ වලංගුව පවත්නා විනිමය පාලන නීති හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත නියෝගයක් උල්ලංඝනය වී ඇති බවට විශ්වාස කිරීමට බැංකුවට හේතු ඇත්නම් බැංකුව විසින් සිය අභිමතය පරිදි මූලික කාඩ්පත් සාමාජිකයාට දැනුම් දීමකින් මූලික කාඩ්පතක් සහ / හෝ ඕනෑම අතිරේක කාඩ්පතක් අවලංගු කරනු ලැබිය හැකි ය.

## 3. කාඩ්පත් සේවා:

කාඩ්පත් සාමාජිකයා කාඩ්පත ලැබුණු වහාම කාඩ්පතේ පිටුපසට අත්සන් කළ යුතු අතර කාඩ්පතෙහි අත්සන අයදුම් පත්‍රයේ අඩංගු අත්සනට සමාන විය යුතුය. කාඩ්පත අන්සතු කළ නොහැකි අතර භාවිතය මෙම ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි සහ බැංකුව විසින් නියම කර ඇති අමතර කොන්දේසි වලට යටත් වේ.

## 4. කාඩ්පත බෙදා හැරීම:

කාඩ්පත කුරියර් සේවාව මගින් හෝ ලියාපදිංචි තැපැලෙන් යවනු ලැබේ. නැතහොත් කාඩ්පත් සාමාජිකයා විසින් හෝ බලයලත් තුන්වන පාර්ශ්වයන් විසින් කාඩ්පත කවුන්ටරයෙන් ලබාගත හැකි ය. මූලික කාඩ්පත් සාමාජිකයා සහ වෙනත් ඕනෑම අතිරේක කාඩ්පත් සාමාජිකයෙකු විසින් කාඩ්පත (කාඩ්පත්) ලබාගන්නා විට ඔහු/ඇය විසින් ඔහුගේ/ඇයගේ අනන්‍යතාව පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ යුතු අතර ලබාදෙන භාරගැනීමේ ලිපිය මත අත්සන් කිරීම මගින් කාඩ්පත ලැබුණ බව පිළිගත යුතු ය.

කාඩ්පත් සාමාජිකයා ඔහු / ඇය වෙනුවෙන් කාඩ්පත භාර ගැනිම හෝ ලබා ගැනිම සඳහා ඔහුගේ / ඇයගේ අභිමතය පරිදි තුන්වන පාර්ශ්වයකට ලිඛිතව බලය පවරනු ලැබිය හැකි අතර කාඩ්පත් සාමාජිකයා විසින් හෝ තමා වෙනුවෙන් බලය පවරන ලද තැනැත්තා විසින් කාඩ්පත භාරගත් වේලාවේ සිට කාඩ්පත මත වැයවන සියලු ගාස්තු සඳහා කාඩ්පත් සාමාජිකයා වගකිව යුතු ය. බැංකුව විසින් සිය අභිමතය පරිදි බැංකුව විසින් තීරණය කරනු ලබන තුන්වන පාර්ශ්වයකට හෝ කාඩ්පත් සාමාජිකයාගේ නියෝජිතයෙකුට කාඩ්පත භාරදිය යුතු ය. කාඩ්පත භාරදුන් වේලාවේ සිට ඒ මත වන සියලු ගාස්තු සඳහා කාඩ්පත් සාමාජිකයා වගකිව යුතු ය.

## 5. කාඩ්පත භාවිත කිරීම:

5.1 කාඩ්පත ලොව පුරා වලංගු වන අතර කෙසේ වෙතත් ඕනෑම අවස්ථාවක ඕනෑම හේතුවක් නිසා සේවා ආයතනයක කාඩ්පත භාවිතා කිරීම ප්‍රතික්ෂේප කිරීමට අදාළ බැංකුවට සහ සේවා ආයතනවලට අයිතියක් ඇත. සද්භාවයෙන් යුත් පෞද්ගලික හෝ නිල කාර්ය සඳහා පමණක් කාඩ්පත භාවිත කළ හැකි අතර කාඩ්පත් සාමාජිකයාගේ ව්‍යාපාරික කටයුතුවලදී වාණිජ වශයෙන් කාඩ්පත භාවිත කිරීමට අවසර දෙනු නොලැබේ. සමහර සේවා ආයතන සඳහා දරනු ලබන ගාස්තුවලට, මිලදී ගැනීම හෝ වෙනත් පහසුකම් ලබා ගැනීම සඳහා ගාස්තුවක් ඇතුළත් විය හැකි බව පැහැදිලි කර ඇත.
5.2 කාඩ්පත් සාමාජිකයා විසින් සියලු අවස්ථාවන්හිදී තම රහස් අංකය (Pin number) සහ ටී - පින් අංකය (T-Pin) රහසිගතව සහ කාඩ්පතින් දුරස්කර තැබිය යුතු අතර කාඩ්පත ආරක්ෂිත ස්ථානයක තැබීමටත් වෙනත් තැනැත්තෙකුට භාවිත කිරීමට ඉඩ නොදීමටත් කාඩ්පත සාමාජිකයා වග බලා ගත යුතු ය. කාඩ්පත් සාමාජිකයා දැනුවත්ව හෝ නොදැනුවත්ව කාඩ්පත සහ / හෝ රහස් අංකය (Pin number) සහ / හෝ ටී - පින් අංකය (T-Pin) යොදාගෙන කරන ගනුදෙනුවල දී කාඩ්පත මත වැයවන සියලු ගාස්තු සඳහා කාඩ්පත් සාමාජිකයා වගකිව යුතු ය.

5.3 සේවා ආයතනයක කාඩ්පත භාවිතා කිරීමෙන් පසු, කාඩ්පත් සාමාජිකයා ගාස්තු පත්‍රිකාවට අත්සන් කරන අවස්ථාවේදී ගාස්තු පත්‍රයේ පිටපතක් ලබා ගත යුතුය. කෙසේ වෙතත්, බැංකුව විසින් නිශ්චිතව දක්වා ඇති සීමාවක් දක්වා වූ ඇතැම් ගනුදෙනු සඳහා කඩදාසි ගාස්තු පත්‍රිකාවක් නිකුත් නොකෙරේ. කාඩ්පත් සාමාජිකයා එය භාවිත කිරීමට ලියාපදිංචි වී ඇත්නම්, කාඩ්පත් සාමාජිකයාට බැංකුවේ ඩිජිටල් නාලිකා (ජංගම බැංකුකරණය, FriMi වැනි) හරහා ගාස්තු පත්‍රිකාවේ පිටපතක් බැලීමට හැකි වනු ඇත. සාමාන්‍යයෙන්, බැංකුව වෙනත් අයකිරීම් පත්‍රවල පිටපත් කාඩ්පත් සාමාජිකයාට ලබා නොදිය යුතුය. කෙසේ වෙතත්, බැංකුවේ අභිමතය පරිදි, බැංකුව විසින් තීරණය කරනු ලබන අතිරේක ගාස්තු ගෙවීම මත පිටපත් ලබා දිය හැකිය.

5.4 තැපැල් ඇණවුමක් හෝ දුරකථන ඇණවුමක් හරහා මිලදී ගැනීම් හෝ අන්තර්ජාලය හරහා ගනුදෙනු කිරීමේ පහසුකම ඔහුට/ඇයට ලබා දීමට බැංකුව විසින් තෝරා බේරා එකඟ විය හැකි බව කාඩ්පත් සාමාජිකයා පිළිගන්නා අතර, එවැනි අවස්ථාවලදී, කාඩ්පත් භාවිතය සඳහා කාඩ්පත් සාමාජිකයා විසින් ගාස්තු

පත්‍ර අත්සන් නොකරනු ඇත. ඒ අනුව, එවැනි මිලදී ගැනීමක හෝ අයකිරීමක සත්‍යතාව හෝ වලංගුභාවය පිළිබඳ යම් ආරවුලක් ඇති වූ විට පවා, කවර හේතුවක් නිසා හෝ කාඩ්පත් සාමාජිකයා විසින් හිඟ මුදල් පියවන බව කාඩ්පත් සාමාජිකයා පිළිගනී. එවැනි ගනුදෙනුවක් සම්බන්ධයෙන් වන යම් ආරවුලක් කාඩ්පත් සාමාජිකයා සහ අදාළ වෙළෙන්දා අතර ඇතිවන ආරවුලක් වන අතර එය එම පාර්ශ්ව දෙක විසින් විසඳා ගත යුතු ය. ඒ සඳහා කවර ආකාරයකින් හෝ බැංකුව වගකිව යුතු නොවේ.

5.5 කාඩ්පත භාවිතා කළ හැක්කේ එහි මුහුණත නෙරා සිටින සේ මුද්‍රණය කර ඇති මාසයේ අවසාන දිනයට හෝ ඊට පෙර පමණි.

5.6 පහත 30.3 වගන්තියේ දක්වා ඇති ආකාරයට මූලික කාඩ්පත් සාමාජිකයා ඊට පටහැනි යමක් බැංකුවට දැනුම් දෙන තෙක් බැංකුවේ අභිමතය පරිදි අලුත් කිරීම සහ/හෝ ප්‍රතිස්ථාපන කාඩ්පත් සෑම කාඩ්පත් සාමාජිකයෙකුටම නිකුත් කරන ලෙස ඔහු/ඇය ස්ථාවර ඉල්ලීමක් කර ඇති බවට කාඩ්පත් සාමාජිකයා එකඟ වේ. කාඩ්පත කල් ඉකුත්වීම, නැතිවීම, හානිවීම හෝ සොරකම් කිරීමක දී කාඩ්පත් පහසුකම අලුත් කිරීමේ අයිතිය බැංකුව සතුය. එවැනි අලුත් කිරීමක් සිදු නොවන අවස්ථාවක, කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුව වෙත ගෙවිය යුතු ශේෂය විරුද්ධත්වයකින් හෝ ප්‍රමාදයකින් තොරව වහාම පියවිය යුතුය.

5.7 කාඩ්පත (කාඩ්පත්) සහ බැංකුව සමඟ කරන සියලුම ගනුදෙනු සම්බන්ධයෙන් සෑම විටම සද්භාවයෙන් කටයුතු කරන බවට කාඩ්පත් සාමාජිකයා විසින් පිළි ගනු ලබයි.

5.8 බැංකුව, අභිමතය පරිදි මූලික කාඩ්පත් සාමාජිකයාට දැනුම් දීමක් සහිතව, ණය සීමාව අත්හිටුවීමට හෝ අඩු කිරීමට සහ කාඩ්පත් සාමාජිකයාට දැනුම් දීමෙන්, ඕනෑම අවස්ථාවක කාඩ්පතේ අවසර ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමට හෝ ගරු කිරීමට ඇති අයිතිය තමා වෙත රඳවා තබා ගනී. ණය සීමාව අත්හිටුවීම, ප්‍රතික්ෂේප කිරීම හෝ අඩු කිරීම හෝ කාඩ්පතේ අවසර ඉල්ලීමක් හේතුවෙන් කාඩ්පත් සාමාජිකයා විසින් අත්විඳින ලද කිසියම් අලාභයක් සහ/හෝ හානියක් සහ/හෝ කීර්ති නාමයට හානි වීමෙන් පැන නගින කිසිදු ප්‍රතිවිපාකයකට බැංකුව වගකිව යුතු නොවේ.

**6. කාඩ්පත විදේශ රටවලදී භාවිත කිරීම:**

මෙම කාඩ්පත ජාත්‍යන්තර වශයෙන් සේවා ආයතනවල ගනුදෙනු සඳහා වලංගු වන අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) මාර්ගෝපදේශයන්ට අනුව එහි භාවිතය හිමිකම් ඉක්මවන්නේ නම්, කාඩ්පත් සාමාජිකයා CBSL වෙතින් අවශ්‍ය අවසරය ලබා ගැනීමට සහ CBSL අවශ්‍යතාවලට අනුකූල වීමට භාර ගනී. කෙසේ වෙතත්, කිසිදු තත්වයක් යටතේ ප්‍රකාශයේ දැක්වෙන පරිදි ගෙවිය යුතු මුදල් ආපසු ගෙවීම ප්‍රමාද කිරීම හෝ නියමිත සීමාව ඉක්මවා වැය කිරීම මත ආපසු ගෙවීම ප්‍රතික්ෂේප කිරීම නොකළ යුතුය.

**7. කාඩ්පත් සාමාජිකයා විදේශගතව සිටින විට:**

ඒ වන විට ක්‍රියාත්මක වූ විනිමය පාලන රෙගුලාසි වල නිර්වචනවලට අනුව "අනේවාසික " ලෙස සලකනු ලබන සංක්‍රමණය වන සහ/හෝ ස්ථිර රැකියාවක් මත විදේශගත වන කාඩ්පත් සාමාජිකයෙකු ලිඛිතව බැංකුවට දැනුම් දිය යුතු අතර, බිල් කළ සහ බිල් නොකළ ගාස්තු සියල්ල පියවිය යුතු අතර මූලික කාඩ්පත සහ ඕනෑම අතිරේක කාඩ්පත් (අදාළ පරිදි) භාර දිය යුතු වේ.

**8. අනේවාසික ශ්‍රී ලාංකිකයන් සඳහා කාඩ්පත (NRSL):**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පවතින මාර්ගෝපදේශයන්ට අනුව කාඩ්පත් තබා ගැනීමට අනේවාසික ශ්‍රී ලාංකිකයන් හට අවසර නැත. එවැනි අවස්ථාවක, කාඩ්පත් සාමාජිකයා විසින් මූලික කාඩ්පත සහ ඕනෑම අතිරේක කාඩ්පතක් (අදාළ වන පරිදි) බැංකුව වෙත ආපසු ලබා දිය යුතුය.

**9. විදේශ ජාතිකයන් සඳහා කාඩ්පත්:**

විදේශීය ජාතික කාඩ්පත් සාමාජිකයෙකුට ඔහු/ඇය ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින්නේ නම් කාඩ්පත භාවිතා කළ හැක. එවැනි විදේශීය ජාතික කාඩ්පත් සාමාජිකයන් ඔහු/ඇය ස්ථිරවම රට හැර යන්නේ නම් මාසයකට පෙර

සහ/හෝ ඔහුගේ නේවාසික වීසා බලපත්‍රය කල් ඉකුත් වීමට මාසයකට පෙර ලිඛිතව බැංකුවට දැනුම් දිය යුතුය. ඔහු/ඇය ඉහත කී සිදුවීම්වලින් එකක් හෝ සිදුවීමට පෙර බිල්පත් සහ බිල් නොකළ ගාස්තු සම්පූර්ණයෙන් පියවිය යුතු අතර කාඩ්පත (කාඩ්පත් ) බැංකුවට භාර දිය යුතුය.

**10. විදේශ ව්‍යවහාර මුදලින් ගනුදෙනු කිරීම:**

10.1 ශ්‍රී ලංකා රුපියල් හැර වෙනත් විදේශීය ව්‍යවහාර මුදලකින් සිදු කරනු ලබන ගනුදෙනු බැංකුව විසින් තීරණය කරනු ලබන විනිමය අනුපාතය අනුව ශ්‍රීලංකා රුපියල්වලට පරිවර්තනය කර කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

10.2 එක්සත් ජනපද ඩොලර් (USD) වලින් වන සියලුම විදේශ මුදල් ගනුදෙනු බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන පවතින USD / LKR විනිමය අනුපාතිකය භාවිතයෙන් පරිවර්තනය කරනු ලැබේ. එක්සත් ජනපද ඩොලර් හැර වෙනත් විදේශ මුදල්වලින් සිදු කරනු ලබන ගනුදෙනු වලදී, එම ගනුදෙනුව බිල්පත් සැකසීමේ මුදල්වලට පරිවර්තනය කිරීමට පෙර ඇමෙරිකන් එක්ස්ප්‍රස් සමාගම විසින් එක්සත් ජනපද ඩොලර් (USD) බවට පරිවර්තනය කරනු ලැබේ. දේශීය විනිමය අනුපාත චලනයන් අවම කිරීම සඳහා අතිරේක මුදලක් (2.5] දක්වා) බිල්පත් කිරීමේදී අනුපාතයට එකතු කරනු ලැබේ.

11. **මුදල් අත්තිකාරම්**:

11.1 කාඩ්පත් සාමාජිකයෙකු විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM), බැංකු ශාඛා, මුදල් ලබා දෙන වෙළෙන්දන්, නියෝජිතයින් හෝ බැංකුවේ ඩිජිටල් නාලිකා හරහා ලබා ගන්නා මුදල් අත්තිකාරම් ATM, බැංකුව, වෙළෙන්දා, නියෝජිත, ප්‍රාදේශීය හෝ රට සීමාවන්ට සහ සීමා කිරීම්වලට යටත් වේ. මහ බැංකු සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසි ද අදාළ වේ. ඔහු/ඇය බැංකුව විසින් නිකුත් කරන ලද රහස් අංකය භාවිතා කරන්නේ නම් මිස කාඩ්පත් සාමාජිකයාට කාඩ්පත සමඟ ATM යන්ත්‍රවලින් මුදල් අත්තිකාරම් ලබා ගැනීමට නොහැකි වනු ඇත.

11.2 කාඩ්පත් සාමාජිකයෙකුට මුදල් අත්තිකාරම් සීමාව දක්වා මුදල් අත්තිකාරම් ලබා ගත හැක. තාවකාලික ණය සීමාව වැඩි දියුණු කිරීම් සහ/හෝ මුදල් තැන්පතු හෝ කාඩ්පත් ගිණුමට අරමුදල් මාරු කිරීම මුදල් අත්තිකාරම් සීමාව කිසිඳු ආකාරයකින් වැඩි කිරීමට හේතු නොවනු ඇත.

11.3 මූලික කාඩ්පත් සාමාජිකයාට දැනුම් දීමක් සමඟ මෙම පහසුකම බැංකුව විසින් වෙනස් කිරීම හෝ ඉවත් කිරීම කළ හැකි වේ.

**12. ණය සීමාව:**

කාඩ්පත සමඟ ලබා දෙන ආවරණ ලිපිය මෙන්ම ප්‍රකාශය කාඩ්පත් ගිණුමට අදාළ වන මූලික ණය සීමාව පෙන්වයි. මූලික කාඩ්පත් සාමාජිකයාට වරින් වර දැනුම් දීමෙන් ණය සීමාව තීරණය කිරීමට සහ එය වැඩි කිරීමට හෝ අඩු කිරීමට කාඩ්පත් සාමාජිකයා බැංකුවට කැමැත්ත පළ කර බලය පවරයි.

වත්මන් ශේෂය ණය සීමාව ඉක්මවන්නේ නම්, කාඩ්පත් සාමාජිකයා එම අතිරේක මුදල සඳහා වහාම ගෙවීමක් කළ යුතුය. ණය සීමාව ඉක්මවන ප්‍රමාණය කුමක් වුවත්, ණය සීමාව ඉක්මවා ගිය හොත් කලින් කලට අදාළ විය හැකි පරිදි සීමාව ඉක්මවා ගිය ගාස්තුවක් කාඩ්පත් ගිණුමට අය කරනු ලැබේ.

**13. කාඩ්පත්වල කාලය අවසන් වීම :**

කාඩ්පත එහි මුහුණතේ මුද්‍රණය කර ඇති කල් ඉකුත්වන දිනය දක්වා වලංගු වේ. කාඩ්පතේ වලංගු භාවය අලුත් කිරීම 5.6 වගන්තියේ විධිවිධාන සළසා ඇති පරිදි සිදු විය යුතු ය.

**14. කාඩ්පත බැංකුවේ දේපළක් ලෙස පවතී** :

කාඩ්පත බැංකුවේ දේපළක් ලෙස පවතී. මූලික කාඩ්පත් සාමාජිකයාගේ හෝ ඕනෑම අතිරේක කාඩ්පත් සාමාජිකයෙකුගේ එය භාවිතා කිරීමට අයිතිය ඕනෑම අවස්ථාවක බැංකුවට අවලංගු කළ හැක. මූලික කාඩ්පත් සාමාජිකයාට දැනුම් දීමක් සමඟ බැංකුව මෙම අයිතිය ක්‍රියාත්මක කළ හැක. බැංකුව විසින් අවලංගු කරන

ලද කාඩ්පත් "අවලංගු කිරීමේ බුලටින්" හි ලැයිස්තුගත කිරීමට හෝ වෙනත් ආකාරයකින් කාඩ්පත අවලංගු කර හෝ අවලංගු කර ඇති බවට සේවා ආයතන වෙත දැනුම් දිය හැකිය. බැංකුව විසින් කාඩ්පත අවලංගු කරන්නේ නම්, කාඩ්පත් සාමාජිකයා එය බැංකුවට ආපසු ලබා දිය යුතුය. එසේම, සේවා ආයතනයක් කාඩ්පත් සාමාජිකයෙකුට කල් ඉකුත් වූ හෝ අවලංගු කළ කාඩ්පතක් භාර දෙන ලෙස ඉල්ලා සිටින්නේ නම්, කාඩ්පත් සාමාජිකයා එය කළ යුතුය. කාඩ්පත් සාමාජිකයා කාඩ්පත කල් ඉකුත් වූ පසුව හෝ එය අවලංගු කිරීමෙන් පසුව භාවිත නොකළ යුතුය. කාඩ්පත අවලංගු කිරීමෙන් හෝ කල් ඉකුත්වීමෙන් පසුව දරනු ලබන සියලුම ගාස්තු සඳහා කාඩ්පත් සාමාජිකයා දිගටම වගකිව යුතුය. අවලංගු කිරීම, නැවත ලබා ගැනීම හෝ කාඩ්පත ආපසු ලබා දීම සඳහා ඉල්ලීමක්, කාඩ්පත් සාමාජිකයාගේ චරිතය හෝ ණය සුදුසුකම් පිළිබඳ කිසිදු පිළිබිඹුවක් නොවිය යුතු අතර, ආපසු ලබා දීම හෝ භාර දීම ඉල්ලා සිටින ඕනෑම පුද්ගලයෙකු විසින් කරන ලද ප්‍රකාශයකට බැංකුව කිසිදු ආකාරයකින් වගකිව යුතු නොවේ. තවද, කාඩ්පතට සම්බන්ධ වරප්‍රසාද සහ පහසුකම් බැංකුවේ අභිමතය පරිදි ඕනෑම වේලාවක මූලික කාඩ්පත් සාමාජිකයාට දැනුම් දීමක් සමඟ ආපසු ලබාගත හැකිය.

15. **ගාස්තු:**

15.1 බැංකුවේ ඉල්ලීම මත බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද දැනට ක්‍රියාත්මක ගාස්තු ක්‍රමවේදය පිළිබඳ ලේඛනයට අනුව නිකුත් කරන විට කාඩ්පත සඳහා බැංකුව විසින් නියම කර ඇති පරිදි සම්බන්ධ වීමේ ගාස්තුවක් සහ නිකුත් කරන විට එක් එක් අතිරේක කාඩ්පත සඳහා බැංකුව විසින් නියම කරන ලද සම්බන්ධ වීමේ ගාස්තුවක් බැංකුවට ගෙවීමට කාඩ්පත් සාමාජිකයා එකඟ වේ.

15.2 කාඩ්පත් සාමාජිකයා වෙනුවෙන් කාඩ්පත් ගිණුම පවත්වාගෙන යාම සඳහා වාර්ෂික ගාස්තුවක් බැංකුවට ගෙවීමට කාඩ්පත් සාමාජිකයා එකඟ වේ (කාඩ්පත භාවිතා කරන්නේද නැද්ද යන්න නොසලකා). බැංකුව මූලික කාඩ්පත් සාමාජිකයාට සන්නිවේදනය කරන පරිදි වාර්ෂික ගාස්තු එවැනි අනුපාතයකින් කල්තියා බිල්පත් මඟින් ඉදිරිපත් කරනු ඇත.

15.3 කාඩ්පත විදේශ ලිපිනයකට කුරියර් කළ විට, බැංකුව විසින් කාඩ්පත් ගිණුමට සැකසීමේ (Handling) ගාස්තුවක් හර කරනු ලැබේ.

15.4 සීමාව වැඩි කිරීම සඳහා සැකසීමේ (Handling) ගාස්තුවක් කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

15.5 ප්‍රකාශවල පිටපත් සඳහා අදාළ ගාස්තුවක් කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

15.6 කාඩ්පත් සාමාජිකයා විසින් ගෙවිය යුතු මුළු හිඟ මුදල ගෙවීමට නියමිත දිනට නොගෙවන්නේ නම්, ප්‍රකාශය නිකුත් කරන දිනයේ මුළු හිඟ ශේෂයට බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට බිල්පත් කාල සීමාව තුළ දෛනික ශේෂය මත ගණනය කරන ලද මූල්‍ය ගාස්තුවක් එකතු කරනු ඇත. මූල්‍ය ගාස්තුව ඊළඟ ප්‍රකාශය නිකුත් කරන දිනයේ කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

15.7 ගෙවිය යුතු අවම ගෙවීම / සම්පූර්ණ අවම ගෙවීම ගෙවීමට කාඩ්පත් සාමාජිකයා අපොහොසත් වුවහොත්, ඉහත 15.6 වගන්තියේ සඳහන් මූල්‍ය ගාස්තු ගෙවීමට අගතියකින් තොරව, බැංකුව විසින් තීරණය කළ යුතු අනුපාතයකට ප්‍රමාද ගෙවීමේ ගාස්තුවක් අයකර කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

15.8 කාඩ්පත් සාමාජිකයා හෝ වෙනත් පාර්ශ්වයක් විසින් නිකුත් කරන ලද හෝ ඉදිරිපත් කරන ලද කිසියම් චෙක්පතක් හෝ වෙනත් ගෙවීමේ නියෝගයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට කිසියම් හේතුවක් නිසා හැකි නොවන්නේ නම්, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතිකයකට සැකසුම් ගාස්තුවක් කාඩ්පත් සාමාජිකයාගෙන් අය කර කාඩ්පත් ගිණුමට හර කරනු ලැබිය හැක. මෙම ගාස්තුව බැංකුව විසින් අය කළ හැකි කිසියම් තැපැල් ගාස්තුවකට අමතරව වේ.

15.9 සියලුම මුදල් අත්තිකාරම් සඳහා මුදල් අත්තිකාරම් ගාස්තුවක් සහ/හෝ සැකසීමේ ගාස්තුවක් අය කරනු ලබන අතර බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ. සංචාරක චෙක්පත්, ඉල්ලුම් අණකරය, විදුලි මුදල් මාරුකිරීම් යනාදී කාඩ්පතෙන් පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි ඕනෑම උපකරණයක් ද මුදල් අත්තිකාරම් ලෙස සලකනු ලබන අතර ඉහත ගාස්තුවට යටත් වේ.

15.10 බිල්පත් කාල සීමාවේ ඕනෑම අවස්ථාවක පවරා ඇති ණය සීමාව ඉක්මවා ගියහොත් සීමාව ඉක්මවා යාමේ ගාස්තුවක් අය කර කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ. එය බිල්පත් කාල සීමාවකට වරක් අය කෙරේ. ණය සීමාව ඉක්මවා තිබේද නැද්ද යන්න ගණනය කිරීමේ කාර්යය සඳහා, ඕනෑම බැංකු ගාස්තු වල ප්‍රමාණයද සලකා බලනු ලැබේ.

15.11 ශ්‍රී ලංකාවේ ඉන්ධන පිරවුම්හල්වලින් ලබා ගත හැකි පෙට්‍රල්, ඩීසල්, ගෑස් සහ අනෙකුත් සැපයුම් මිලදී ගැනීම් සඳහා සැකසුම් ගාස්තුවකට යටත් වන අතර, එය බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

15.12 විකුණුම්වල /මුදල් අත්තිකාරම් අණකර ඡායාපිටපත් සඳහා ප්‍රතිසාධන ගාස්තුවක් බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

15.13 කලින් කලට අදාළ විය හැකි ඕනෑම ව්‍යවස්ථාපිත ගාස්තුවක් (ගාස්තු) කාඩ්පත් ගිණුමට එය/ඒවා අදාළ වන විට අය කෙරේ.

15.14 කාඩ්පතට අදාළ මූල්‍ය ගාස්තු සහ අනෙකුත් ගාස්තු සහ අයකිරීම් පිළිබඳ විස්තර බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ගාස්තු ලේඛනයෙහි සඳහන් කර ඇති අතර, ඒවායේ පිටපත් ශ්‍රී ලංකාවේ ඕනෑම බැංකුවක ශාඛාවකින් සහ බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානයකින් ඉල්ලීම මත ලබා ගත හැකිය. හෝ බැංකුවේ ආයතනික වෙබ් අඩවිය වන www.nationstrust.com හෝ www.americanexpress.lk වෙතින් බාගත කර ඇත. සියලුම අයකිරීම්, ගාස්තු, පොලී අනුපාත, දඩ සහ අන්තයන් බැංකුවේ අභිමතය පරිදි දැනුම්දීමත් සමඟ වෙනස් වීමට යටත් වන අතර ගාස්තු අයකිරීම්වලට එවැනි වෙනස් කිරීම්/එකතු කිරීම් ප්‍රකාශයක් හෝ ඒ සමඟ අමුණා ඇති ප්‍රකාශයක් මඟින් හෝ එවැනි වෙනස් කිරීම්/එකතු කිරීම් පිළිබඳ දැනුම්දීමක් ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරන ලද පුවත්පත් එකක හෝ කිහිපයක හෝ බැංකුවේ ශාඛාවල දැන්වීම් පුවරුවේ ප්‍රකාශයට පත් කිරීම මගින් මූලික කාඩ්පත් සාමාජිකයා වෙත දැනුම් දෙනු ලැබේ.

15.15 කාඩ්පත් සාමාජිකයෙකුගේ ඉල්ලීම මත සිදුකරන ඕනෑම අමතර සේවාවක් සඳහා ගාස්තුවක් අය කිරීමට සහ එම ගාස්තුව සමඟ කාඩ්පත් ගිණුමෙන් හර කිරීමට බැංකුවට අයිතිය ඇත.

15.16 බැංකුව විසින් කලින් කලට පිරිනමනු ලබන කිසියම් ගාස්තු අඩු කිරීමක් හෝ අත්හැරීමක්, මූලික කාඩ්පත් සාමාජිකයාට දැනුම් දීමක් ඇතිව බැංකුව විසින් ඕනෑම වේලාවක එහි අභිමතය පරිදි ඉල්ලා අස්කර ගැනීමට හෝ සීමා කිරීමට හැකිය. බැංකුව විසින් තම අභිමතය පරිදි කාඩ්පත් වර්ගය සහ අවස්ථාවන් අනුව සමහර ගාස්තු නිදහස් කළ හැක.

### 16. ගුවන් සේවා සමාගම් සමඟ ගනුදෙනු :

කාඩ්පතක් භාවිතයෙන් ගුවන් ටිකට් පතක් වෙන්කරවා ගත් විට, කාඩ්පත් සාමාජිකයා අදාළ වේ නම් යම් අමතර ගාස්තුවලට යටත්ව ප්‍රවේශපත්‍ර මිලදී ගැනීම සඳහා ගෙවීමට අවශ්‍ය වන අතර, එය ප්‍රකාශය තුළ බිල් කරනු ලැබේ. පසුව අවලංගු කරන ලද ඕනෑම ප්‍රවේශ පත්‍රයක් සඳහා, සේවා ආයතනයෙන් බැංකුවට බැර වූ විට එම මුදල කාඩ්පත් ගිණුමට (අවලංගු කිරීමේ ගාස්තු අඩු කර) බැර කෙරේ.

### 17. ආරවුල්:

24 වගන්තිය අනුව කාඩ්පත නැතිවූ හෝ සොරකම් කර ඇති විටෙක බැංකුවට නිසි ලෙස දන්වා ඇති අවස්ථාවක දී හැර ගෙවීම සඳහා සේවා ආයතනයකින් බැංකුවට ලැබෙන යම් ගාස්තුවක් හෝ වෙනත් ගෙවීම් ඉල්ලීමක්, එම ඉල්ලීම මත වාර්තා කරන ලද ගාස්තුව සේවා ආයතනයේ දී එම ගෙවීම් ඉල්ලීමෙහි සඳහන් කර ඇති අවස්ථාව පරිදි, කාඩ්පත භාවිතා කිරීමෙන් කාඩ්පත් සාමාජිකයා විසින් නිසි පරිදි දැරූ බවට තීරණාත්මක සාක්ෂියක් විය යුතු වන්නේය. මෙම වගන්තියේ සඳහන් අනෙකුත් ගෙවීම් ඉල්ලීම්වලට විවිධ හෝටල් ගාස්තු යනාදී ගාස්තුවක් ලෙස සටහන් කර නොමැති කාඩ්පත භාවිතා කිරීමෙන් සේවා ආයතනයක කාඩ්පත් සාමාජිකයෙකු විසින් දරනු ලබන අවසර ලත් වියදම්වලට අදාළ ඕනෑම සහ සියලුම ගෙවීම් ඇතුළත් විය යුතුය. එවැනි අය කිරීමේ පත්‍රිකාවක කාඩ්පත් සාමාජිකයාගේ අත්සන එහි සටහන් කර ඇති කාඩ්පත් අංකය සමඟ කාඩ්පත් සාමාජිකයා විසින් දරනු ලබන වගකීම් ප්‍රමාණය පිළිබඳව බැංකුව සහ කාඩ්පත් සාමාජිකයා අතර අවසානාත්මක සාක්ෂියක් විය යුතු අතර සාමාජිකයාගේ තෘප්තියට පත් වන අයුරින් මිලදී ගත්/මිලදී ගැනීමට නියමිත භාණ්ඩ ලැබී ඇති බවට හෝ ලබා ගත් හෝ ලබා ගැනීමට අපේක්ෂිත සේවය නිසි පරිදි ලැබී

ඇති බවට සහතික කිරීමට බැංකුව අවශ්‍ය නොවේ. ප්‍රකාශයේ දක්වා ඇති ගාස්තුවකට කාඩ්පත් සාමාජිකයා එකඟ නොවන්නේ නම්, ප්‍රකාශය ලැබී දින 20ක් ඇතුළත බැංකුව වෙත ළඟා වන ලෙස එය දැනුම් දිය යුතු අතර, එසේ නොකළහොත්, සියලු ගාස්තු සහ ප්‍රකාශ සම්පූර්ණයෙන්ම නියමිත පරිදි පවතින බව වටහා ගත හැකිය. එකඟ නොවීම පිළිබඳ දැන්වීම ලැබීමෙන් පසු මෙම ප්‍රකාශවල දක්වා ඇති අදාළ ගාස්තුව හේතුවෙන් අගතියට පත් කාඩ්පත් සාමාජිකයාගේ එකඟ නොවීම විසඳීමට බැංකුව සද්භාවයෙන් යුතු සහ වාණිජමය වශයෙන් සාධාරණ උත්සාහයන් දැරිය යුතුය. එවැනි උත්සාහයකින් පසුව, ප්‍රකාශයේ දක්වා ඇති ගාස්තුව නිවැරදි බව බැංකුව තීරණය කරන්නේ නම්, ගාස්තු පත්‍රිකාවේ පිටපතක් හෝ ගෙවීම් ඉල්ලීම ඇතුළු විස්තර සමඟ කාඩ්පත් සාමාජිකයාට එය දැනුම් දිය යුතුය. ඉන් පසුව කාඩ්පත් සාමාජිකයා විරුද්ධත්වයකින් තොරව, පොලී ඇතුළුව වෙනත් ඕනෑම අයකිරීමක් සඳහා ගෙවීම් කළ යුතු අතර, බැංකුවට ගෙවිය යුතු එවැනි ගෙවීම් ආපසු අයකර ගැනීමට බැංකුවට හිමිකම් ඇත. මතභේදයට තුඩු දී ඇති ගනුදෙනු හේතුවෙන් ආපසු ගෙවීම් හෝ ආපසු හැරීම් ඇතුළුව ගනුදෙනුවක් අවලංගු කිරීම, ආපසු හැරවීම හෝ ආපසු ගෙවීමේ ප්‍රතිඵලයක් ලෙස සිදුවිය හැකි ඕනෑම හුවමාරු පාඩුවක් සඳහා කාඩ්පත් සාමාජිකයා වගකිව යුතුය.

### 18. කාඩ්පත අගරු කිරීම:

කිසියම් විශේෂිත සේවා ආයතනයක් විසින් කාඩ්පත පිළිගනු ලබන බවට බැංකුව කිසිදු සහතිකයක් ලබා නොදෙන අතර, කාඩ්පත පිළි ගැනීම කිසියම් සේවා ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් වගකීමක් භාර නොගනී.

### 19. නම සහ ලිපිනය වෙනස්වීම:

මූලික කාඩ්පත් සාමාජිකයා 30.3 වගන්තියේ දක්වා ඇති ආකාරයට නම හෝ ලිපිනයෙහි යම් වෙනසක් සිදු වුවහොත් බැංකුවට දැනුම් දිය යුතුය.

### 20. භාණ්ඩ හා සේවාවල ගුණාත්මකභාවය:

බෙදා හැරීමේ ප්‍රමාදය, භාර නොදීම සහ භාණ්ඩ නොලැබීම හෝ තැපැල් ඇණවුමෙන් දෝෂ සහිත භාණ්ඩ ලැබීම ඇතුළුව සේවා ආයතනවලින් කාඩ්පත් සාමාජිකයා විසින් මිලදී ගන්නා ලද හෝ ලබා ගන්නා භාණ්ඩ, වගකීමේ සහතික හෝ සේවා සඳහා බැංකුව කිසිදු ආකාරයකින් වගකිව යුතු නොවේ. කාඩ්පත් පහසුකම හුදෙක් කාඩ්පත් සාමාජිකයාට භාණ්ඩ මිලදී ගැනීමට හෝ සේවා ලබා ගැනීමට ඇති පහසුකමක් බවත්, භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ප්‍රමිතිය, ප්‍රමාණය, බෙදාහැරීම හෝ වෙනත් ආකාරයකින් බැංකුව කිසිදු වගකීමක් හෝ නියෝජනයක් නොකරන බවත් ඇතිවන ඕනෑම ආරවුලක් සේවා ආයතනය සමඟ කාඩ්පත් සාමාජිකයා විසඳා ගත යුතු බවත් පැහැදිලිව අවබෝධ කර ගත යුතු වේ.

### 21. කාඩ්පත් සාමාජිකයින් සඳහා රක්ෂණ ආරක්ෂණය:

බැංකුව තම අභිමතය පරිදි කලින් කලට විවිධ රක්ෂණ නිෂ්පාදන කාඩ්පත් සාමාජිකයෙකුට ලබා දිය හැක. කෙසේ වෙතත්, එවැනි රක්ෂණයක් සඳහා ඕනෑම හිමිකම් පෑමක් එවැනි රක්ෂණයක් සපයන රක්ෂණ සමාගම වෙත සෘජුවම ඉදිරිපත් කළ යුතුය. රක්ෂණයක් නොගෙවීම හෝ එවැනි රක්ෂණයක් හේතුවෙන් පැන නගින වෙනත් ආරවුලක් සඳහා බැංකුව වගකිව යුතු නොවන අතර කාඩ්පත් සාමාජිකයා සහ රක්ෂණ සමාගම අතර එවැනි ගැටළු විසඳා ගත යුතුය. අදාළ වන සියලුම රක්ෂණ ආවරණ පිළිබඳව බැංකුව විසින් කලින් කලට දැනුම් දෙනු ලබන අතර, එය බැංකුවේ අභිමතය පරිදි සංශෝධන හෝ වෙනස් කළ හැක. විවිධ රක්ෂණ ඔප්පු සඳහා රක්ෂණ සමාගම විසින් තීරණය කරනු ලබන එකිනෙක වෙනස් නියමයන් සහ කොන්දේසි අදාළ වේ. ඉල්ලීම මත නියමයන් සහ කොන්දේසි සහිත ප්‍රතිපත්ති ඉදිරිපත් කරනු ලැබේ.

### 22. වගකීම බැහැර කිරීම:

1. පහත සඳහන් අවස්ථාවලදී සෘජුවම හෝ අන්‍යාකාරයකින් පැන නගින යම් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් කාඩ්පත් සාමාජිකයා වෙත බැංකුව කිසිදු වගකීමක් දරනු නොලැබේ:-

(a) වෙළෙන්දා විසින් සපයනු ලබන භාණ්ඩ හෝ සේවා වල ඇති යම් දෝෂයක්;

(b) කාඩ්පත භාරගැනීමට හෝ පිළිගැනීමට යම් පුද්ගලයෙකු විසින් ප්‍රතික්ෂේප කිරීම;

(c) යම් පරිගණක පර්යන්තයක් ඒ ටී එම් යන්ත්‍රයක් සහ/හෝ අලෙවි කිරීමේ ස්ථානයක (EDC) යන්ත්‍රයක් අක්‍රියවීම;

(d) කාඩ්පත් සාමාජිකයා හැර වෙනත් තැනැත්තෙකු විසින් ගනුදෙනු උපදෙස් ලබාදීම;

(e) කාඩ්පත ආපසු භාර දෙන ලෙස ඉල්ලා සිටිමින් යම් තැනැත්තෙකු විසින් කරන ලද ප්‍රකාශයක් හෝ එවැනි ඉල්ලීමකට අදාළව යම් තැනැත්තෙකු විසින් කරනු ලබන ප්‍රකාශයක් ;

(f ) බැංකුවේ නියමිත නිලධාරියා හැර වෙනත් තැනැත්තෙකුට කාඩ්පත් සාමාජිකයා විසින් කාඩ්පත භාරදීම ;

(g) කාඩ්පතේ මුද්‍රණය කර ඇති කල් ඉකුත්වීමේ දිනයට පෙර කාඩ්පත ආපසු භාරදෙන ලෙස හෝ ලබාදෙන ලෙස කරනු ලබන ඉල්ලීම බැංකුව විසින් සිදු කළද නැතහොත් බැංකුවේ නියෝජිතයෙකු විසින් සිදු කළද එසේ ඉල්ලා සිටීමට බැංකුවට ඇති අයිතිය බැංකුව විසින් ක්‍රියාත්මක කිරීම ;

(h) කාඩ්පත හෝ කාඩ්පත් ගිණුම නවතා දැමීමට බැංකුවට ඇති අයිතිය බැංකුව විසින් ක්‍රියාත්මක කිරීම ;

(i) කාඩ්පත ආපසු භාරදෙන ලෙස ඉල්ලා සිටීම මගින් හෝ කාඩ්පත පිළිගැනීමට හෝ භාරගැනීමට වෙළෙන්දා විසින් ප්‍රතික්ෂේප කිරීම මගින් බැංකුව විසින් කාඩ්පත් සාමාජිකයාට සිදු කරනු ලැබූ බව කියනු ලබන කාඩ්පත් සාමාජිකයාගේ කීර්ති නාමයට සිදු වූ හානියක් ;

(j) 23වන වගන්තිය ප්‍රකාරව බැංකුව එළිදරව් කරන ලද තොරතුරුවල යම් වැරදි ප්‍රකාශයක් වැරදි නියෝජනයක් වරදක් හෝ අත්හැරීමක් ;

k) යම් හේතුවක් නිසා ගාස්තු ගෙවීම ප්‍රතික්ෂේප කිරීම;

2. බැංකුව හෝ බැංකුව වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තෙකු විසින් කාඩ්පත් සාමාජිකයාගෙන් හිඟ මුදල් පියවීම සඳහා ඉල්ලීමක් හෝ හිමිකම් පෑමක් සිදු කරන්නේ නම්, කාඩ්පත් සාමාජිකයා එකඟ වන අතර එවැනි ඉල්ලීමක් හෝ හිමිකම් පෑමක් කිසිදු ආකාරයකින් අපහාස කිරීමේ ක්‍රියාවක් ලෙස හෝ අගතිගාමී හෝ කාඩ්පත් සාමාජිකයාගේ චරිතය පිළිබිඹු කරන ක්‍රියාවක් සැලකිය යුතු යුතු නොවන බව පිළිගනී.

3. විවිධ සේවාවන් සඳහා වූ සන්නිවේදන සහ වැඩ පිළිවෙලවල් තුන්වන පාර්ශ්වයේ සේවා සපයන්නෙකු විසින් හෝ එවැනි සේවා සපයන්නෙකුගේ කොන්ත්‍රාත්කරුවන් විසින් ලබාදෙන අතර ඒ සඳහා එම තුන්වන පාර්ශ්වයේ සේවා සපයන්නා විසින් හෝ බැංකුව විසින් මුදල් ගෙවනු ලැබේ. උපරිම උත්සාහ පදනම මත සහය ලබාදෙන අතර කාලය දුර සහ ස්ථානය යන ප්‍රශ්න නිසා ලබා දීමට නොහැකි වනු ඇත. තුන්වන පාර්ශ්වයේ සේවා සපයන්නන් විසින් යෝජනා කරනු සහ/හෝ නම් කරනු ලබන රක්ෂණ වෛද්‍ය සහ/හෝ නීති වෘත්තිකයන් ඔවුන්ගේ සේවා නියුක්තයන් හෝ තුන්වන පාර්ශ්වයේ සේවා සපයන්නන්ගේ කොන්ත්‍රාත්කරුවන්ගේ සේවා නියුක්තයන් නොවේ. එම නිසා යම් රක්ෂණ, වෛද්‍ය, නීති හෝ වෙනත් සේවා ලබාදීම භාවිතය ක්‍රියාවන්, මඟ හැරීම්හෝ ප්‍රතිඵල සඳහා ඔවුන් වගකිව යුතු නොවේ. ඉහත කී පාර්ශ්වයන් විසින් සපයනු ලබන සේවාවල වැඩපිළිවෙල හෝ භාවිතය සඳහා නැතහොත් එම පාර්ශ්වන්ගේ ක්‍රියා හෝ මඟ හැරීම් මී සඳහා කවර හෝ ස්වභාවයක වගකීමක් හෝ බැඳී සිටිමක් බැංකුව භාර නොගනී.

## 23. තොරතුරු හෙළිදරව් කිරීම:

මෙහි මින්මතු 23වන වගන්තියේ විධිවිධාන සළසා ඇති කරුණුවලට යටත්ව නීතිය මගින් නියම කර ඇති ප්‍රමාණයට කාඩ්පත් සාමාජිකයා සහ බැංකුව අතර ගනුදෙනු හෝ කටයුතු පිළිබඳ සියලු තොරතුරුවල රහස්‍යභාවය බැංකුව විසින් සුරකිනු ලැබිය යුතු අතර යම් ඉහත කී කරුණු නොතකා පහත සඳහන් ආයතනවලට හෝ තැනැත්තන්ට කාඩ්පත් සාමාජිකයා පිළිබඳ සහ/හෝ ගිණුම් පිළිබඳව තොරතුරු ලබාදීමට කාඩ්පත් හිමියා බැංකුවට බලය පවරයි:

(a) ගෙවීම් පැහැර හරින යම් බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට හෝ ණය තොරතුරු කාර්යංශයකට හෝ ණය තොරතුරු කාර්යංශයක් හෝ දත්ත මූල්‍යශ්‍රයක් පවත්වාගෙන යන පොදු සේවා සපයන්නෙකුට

(b ) බැංකුවේ යම් සත්‍ය හෝ යෝජිත පැවරුම් ලාභියෙකුට හෝ ගිණුමකට හෝ ගිණුමට අදාළව බැංකුවේ අයිතිවාසිකම් පැවරීමේ දී සහභාගිවන්නෙකුට හෝ උප සහභාගි වන්නෙකුට ;

(c) බැංකුවට හෝ අදාළ සමාගමකට රහස්‍යභාවය පිළිබඳ කාර්ය භාරයන් යටතේ වූ යම් නියෝජිතයෙකුට කොන්ත්‍රාත්කරුවෙකුට හෝ සේවා සපයන්නෙකුට

(d) යම් අධීක්ෂණ හෝ නියාමන අධිකාරයකට ;

(e) ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූලව තොරතුරු සැපයීමට අණ කරනු ලැබූ යම් තැනැත්තෙකුට ;

f) වාණිජ භාවිතය සඳහා බැංකුව හා ආශ්‍රිත යම් සමාගමක කාර්යාලයකට හෝ ශාඛාවකට, හෝ

(g) ඇමෙරිකන් එක්ස්ප්‍රස් සමාගමට හෝ එහි ආශ්‍රිත සමාගමකට හෝ ඇමෙරිකන් එක්සප්‍රස් සමාගමේ අභිමතය පරිදි වෙනත් පාර්ශ්වයකට ;

**24. නැති වූ කාඩ්පතේ වගකීම:**

24.1 කාඩ්පතක් නැතිවුවහොත් හෝ සොරකම් කරනු ලැබුවහොත් කාඩ්පත් සාමාජිකයා විසින් ඒ බව වහාම ශ්‍රී ලංකාවේ පිහිටි බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානයට දැනුම් දිය යුතු ය. කාඩ්පත් සාමාජිකයා විසින් කාඩ්පත නැති වූ /සොරකම්කල ප්‍රදේශයේ පොලීසියට/නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයකට පැමිණිල්ලක් කල යුතු ය. කාඩ්පත නැතිවීම පිළිබඳව ශ්‍රී ලංකාවේ පිහිටි ඇමතුම් මධ්‍යස්ථානයට දැනුම් දෙනතුරු කාඩ්පත මත දැරීමට සිදු වූ ගාස්තු ගෙවීමට කාඩ්පත් සාමාජිකයා යටත් වන්නේ ය. කාඩ්පතේ පිටුපස මුද්‍රණය කර ඇති බැංකුවේ පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංකය ඇමතීමෙන් නැති වූ කාඩ්පතක් පිළිබඳව කාඩ්පත් සාමාජිකයාට වාර්තා කළ හැකි අතර ඉන්පසු කාඩ්පත නැති වූ බව ස්ථිර කරමින් සහ ගාස්තු ඉල්ලා නොසිටින බව සඳහන් කරන දිවුරුම් ප්‍රකාශයක පිටපතක් බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානයට යැවිය යුතු ය. එසේම ඒ සමග කාඩ්පත නැති වූ ප්‍රදේශයේ පොලීසියට/නීති ක්‍රියාත්මක කිරීමේ ආයතනයට කරන ලද පැමිණිල්ලේ පිටපතක් ද බැංකුවට යැවිය යුතු ය. බැංකුව විසින් ප්‍රමාණවත් ලෙස සොයා බැලීමෙන් පසු කාඩ්පත තාවකාලිකව අත්හිටුවනු ලැබිය යුතු ය. නැතහොත් අවහිර (Block) කරනු ලැබිය යුතු ය. ඒ සම්බන්ධයෙන් කාඩ්පත සාමාජිකයාට සිදුවන යම් අපහසුතාවයක් සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබේ. ශ්‍රී ලංකාවේ පිහිටි බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානයට නිසි පරිදි දැනුම් දෙනතුරු කාඩ්පත අනවසර ලෙස භාවිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ගිණුමට හර කරන ලද සියලු මුදල් ප්‍රමාණ සඳහා සහ ගිණුමට හර කිරීමට ඇති ගනුදෙනු සඳහා වන මුදල් ප්‍රමාණ සඳහා කාඩ්පත් සාමාජිකයා වගකිව යුතු ය. කාඩ්පතක් නැතිවූ, සොරකම් කළ හෝ හානි වූ බවට වාර්තා වූ පසු, එම කාඩ්පතම භාවිතා කිරීමට බැංකුව විසින් අවසර ලබා දී ඇත්නම් මිස, පසුව සොයා ගත්තද, කාඩ්පත නැවත භාවිත නොකළ යුතුය. එමගින් අගරු ගනුදෙනු සිදු විය හැකි බැවිනි. කාඩ්පතක් නැති වූ විට සොරකම් කරනු ලැබූ විට හෝ අලාභහානි සිදු වූ බව වාර්තා කරනු ලැබුවහොත් සහ පසුව එය සොයාගනු ලැබුවහොත් කාඩ්පත බැංකුවට භාරදීම මගින් එය අවලංගු කිරීම සඳහා කාඩ්පත් සාමාජිකයා පමණක් වගකිව යුතු බව කාඩ්පත් සාමාජිකයා ප්‍රකාශ කර සිටී. කාඩ්පතේ සුරක්ෂිතභාවය සඳහා කාඩ්පත් සාමාජිකයා වගකිව යුතු අතර එය ආරක්ෂා කිරීම සඳහා සියලු පියවර ගත යුතු ය. ඉහත සඳහන් පියවර සැක සහිත බව බැංකුව තීරණය කරන්නේ නම්, එය කාඩ්පත් ගිණුම අවලංගු කළ හැකිය.

24.2 කාඩ්පත නැතිවීම සොරකම් කිරීම හෝ අනිසි භාවිතය පිළිබඳ කාඩ්පත් සාමාජිකයා සතු සියලු තොරතුරු කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුවට ලබා දිය යුතු අතර නැති වූ කාඩ්පත සොයා ගැනීමට බැංකුවට ආධාර කිරීම සඳහා අවශ්‍ය යයි බැංකුව සළකන සියලු පියවර කාඩ්පත් සාමාජිකයා විසින් ගත යුතු ය.

24.3 කාඩ්පත් නැතිවීම සම්බන්ධයෙන් වෙළඳ ජාලයට දැනුම්දීම සඳහා පරිපාලන ගාස්තු වශයෙන් බැංකුව විසින් ගාස්තුවක් අය කරනු ලැබේ.

24.4 නැතිවීමෙන් හෝ සොරකම් කිරීමෙන් පසු කාඩ්පත් සාමාජිකයාට ප්‍රතියෝජන කාඩ්පතක් නිකුත් කිරීමට බැංකුව කිසිම බැඳීමකට යටත් නොවේ. යම් ප්‍රතියෝජන කාඩ්පතක් සැකසීමේ ගාස්තුවකට යටත් වන අතර බැංකුව විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණ අනුව එකී මුදල ගිණුමට හර කරනු ලැබේ. ප්‍රතියෝජන කාඩ්පත බැංකුව විසින් තීරණය කරනු ලබන පරිදි මුල් කාඩ්පතට අදාළ කොන්දේසි හා නියමයන් මතම නිකුත් කළ යුතු ය.

24.5 රහස් අංකය (PIN) හෝ ටී - පින් අංකය (T-PIN) නැතිවුවහොත් සොරකම් කරනු ලැබුවහොත් හෝ වෙනත් පාර්ශ්වයකට හෙළිදරව් කරනු ලැබුවහොත් 24.1 සහ 24.2 වගන්තිවල සඳහන් පරිදි නැතිවීම හෝ හෙළිදරව් කිරීම පිළිබඳ තොරතුරු කාඩ්පත් සාමාජිකයා වහාම බැංකුව වෙත දැනුම් දිය යුතු ය.

**25. ගෙවීම:**

25.1 ප්‍රකාශය ගෙවිය යුතු අවම ගෙවීම් පෙන්වයි. මෙම මුදල බැංකුව විසින් කලින් කලට, ප්‍රකාශයේ ඇති මුළු හිඟ මුදලේ ප්‍රතිශතයක් ලෙස හෝ ස්ථාවර අයකිරීම් අනුපාතයක් ලෙස (ඉහළ කුමන එකක්ද යන්න) තීරණය කරනු ඇත. ගෙවිය යුතු අවම ගෙවීම කාඩ්පත් සාමාජිකයා විසින් ගෙවිය යුතු දිනට හෝ ඊට පෙර බැංකුවට ගෙවිය යුතුය.

කාඩ්පත් ගිණුම කල් ඉකුත් වී ඇත්නම් හෝ ණය සීමාව ඉක්මවා ඇත්නම් කාඩ්පත් සාමාජිකයා වහාම බැංකුවට ගෙවීමට අවශ්‍ය වනු ඇති අතර, එය ප්‍රකාශයේ දැනුම් දෙනු ලැබේ. කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුවට කරන ගෙවීම, ගෙවිය යුතු අවම ගෙවීමට වඩා වැඩි විය හැකිය, නැතහොත් ගෙවීම් නියමිත දිනට පෙර හෝ බිල්පත් කාලය තුළ එක් වරකට වඩා සිදු කළ හැකිය. බැංකුවට එවැනි ගෙවීම් ප්‍රකාශයේ දක්වා ඇති ආකාරයට ශ්‍රී ලංකා රුපියල් වලින් කළ යුතුය.

25.2 ප්‍රකාශය ලැබුණු පසු, ප්‍රකාශයේ විස්තර කර ඇති අවම වශයෙන් ගෙවිය යුතු මුළු මුදලවත් කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුවට ගෙවිය යුතු අතර,. කාඩ්පත් සාමාජිකයා විසින් ප්‍රකාශය ලැබීමෙන් පසු ගෙවිය යුතු මුළු අවම ගෙවීම බැංකුව වෙත ගෙවීමට සෑම පරිපූරක කාඩ්පත් සාමාජිකයෙකුම මූලික කාඩ්පත් සාමාජිකයා සමඟ ඒකාබද්ධව සහ තනිව වගකිව යුතුය.

25.3 මෙම නියමයන් සහ කොන්දේසි කිසිවක් බැංකුව සහ කාඩ්පත් සාමාජිකයා අතර කලින් කලට පවතින වෙනත් ගිවිසුමකට අනුව හෝ නීතියෙන් මුදල් ගෙවීමේ, මාරු කිරීමේ සහ යෙදවීමේ බැංකුවේ අයිතියට බලපාන්නේ නැත. බැංකුව යටතේ තබා ඇති තැන්පතුවක් ඇප ලෙස තබා කාඩ්පත් ගිණුම් විවෘත කර ඇති විට ගෙවිය යුතු මුදල් / හිඟ මුදල් ඇත්නම් , තැන්පතුවේ මුදලින් කාඩ්පත් ගිණුමේ හිඟ මුදල් ගලපා ගනු ඇත.

25.4 අදාළ නිෂ්කාශන අරමුදල් බැංකුව වෙත ලැබෙන තෙක් කාඩ්පත් සාමාජිකයාගේ වගකීම් සම්බන්ධයෙන් බැංකුව වෙත ගෙවීම් සිදු නොකළ බව සලකනු ලැබේ.

25.5 මෙම නියමයන් සහ කොන්දේසි යටතේ බැංකුවට ගෙවිය යුතු සියලුම මුදල් ප්‍රති හිමිකම් පෑමකින් හෝ වෙනත් ආකාරයකින් බැංකුවෙන් හෝ වෙනත් අයකුගෙන් අයවිය යුතු හෝ හිඟ යැයි කියනු ලබන යම් මුදලක් අඩු කිරීමකින් තොරව සහ නීතිමය සීමාවක්, ඕනෑම කාඩ්පත් සාමාජිකයෙකුගේ ආබාධිතභාවයක් හෝ අයෝග්‍යතාවක් තිබියදී වුවත් ගෙවිය යුතු වන්නේය. කාඩ්පත් සාමාජිකයාට අයත් සහ බැංකුව සන්තකයේ, පාලනයේ ඇති හෝ යටතේ ඇති සියලුම වත්කම්/මුදල්/තැන්පතු/සුරැකුම්පත් මත බැංකුවට පොදු කැප බලයක් ඇත.

25.6 ඉහත එකඟ වූ පරිදි නියමිත දිනවලදී, ගෙවිය යුතු පොලී ප්‍රමාණය සමඟ කාඩ්පත යටතේ හෝ ඊට අදාළව ගෙවිය යුතු සියලුම ප්‍රමාද වූ මුදල් අයකර ගැනීම සඳහා, කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුවේ අභිමතය පරිදි කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම්, ඉතුරුම් ගිණුම්, ස්ථාවර තැන්පතු ගිණුම් සහ/හෝ වෙනත් ඕනෑම ගිණුමකින් හර කිරීමට ආපසු හැරවිය නොහැකි ලෙස එකඟ වී බැංකුවට බලය පවරයි. බැංකුව වෙත ලබා දී ඇති එවැනි නිර්බාධිත අයිතිය සහ ආපසු හැරවිය නොහැකි අධිකාරිය, චෙක්පත්, ඉල්ලීම් හෝ මුදල් ආපසු ගැනීම් හෝ කාඩ්පත් සාමාජිකයා විසින් දිනට හෝ ඊට පෙර බැංකුවෙන් ලබා ගත් වෙනත් ලේඛන අගරු කිරීම හෝ ගෙවීම ප්‍රතික්ෂේප කිරීම දක්වා පවා බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි අතර එවැනි අයිතියක් හෝ අධිකාරියක් ක්‍රියාත්මක කිරීම සහ බැංකුවේ එවැනි

ක්‍රියාවක් හේතුවෙන් බැංකුවට එරෙහිව කළ හැකි සියලුම හිමිකම්පෑම් හෝ ඉල්ලීම්වලට එරෙහිව බැංකුව හානිපූරණය කිරීමට කාඩ්පත් සාමාජිකයා මෙයින් එකඟ වේ. හිඟ මුදල අයකර ගැනීමට පහසුකම් සැලසීම පිණිස අදාළ ගිණුමේ අවශ්‍ය අරමුදල් ප්‍රමාණය රඳවා තබා ගැනීමට කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුවට කැමැත්ත පළ කර බලය පවරයි.

25.7 භාණ්ඩ සහ/හෝ සේවා සැපයීම සම්බන්ධයෙන් ලබා දෙන ඕනෑම බැරකමක් බැංකුව විසින් කාඩ්පත් ගිණුමට බැර කරනු ලබන්නේ බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය මඟින් බැංකුවට පිළිගත හැකි පෝරමයකින් දන්වනු ලැබීමෙන් පසුව පමණි.

25.8 කිසියම් හේතුවක් නිසා ගෙවීම් නියෝජනය කරන චෙක්පතක් අණ ලද බැංකුව විසින් හරවා එවන අවස්ථාවක, නීතිය යටතේ අදාළ විය හැකි අපරාධ නඩු කටයුතු සඳහා කාඩ්පත් සාමාජිකයා වගකිව යුතුය.

25.9 කාඩ්පත් සාමාජිකයාගේ මරණය, බංකොලොත්භාවය හෝ ව්‍යාපාරය අවසන් වීමකදී කාඩ්පත් ගිණුමේ ඇති සම්පූර්ණ හිඟ මුදල් කාඩ්පත් සාමාජිකයා, ඔහුගේ අනුප්‍රාප්තිකයන් හෝ පැවරුම්කරුවන් විසින් සම්පූර්ණයෙන්ම ගෙවිය යුතුය. කාඩ්පත් සාමාජිකයාගේ සේවා යෝජකයෙකු විසින් ආපසු ගෙවීමේ වගකීම දරන්නේ නම් සහ එවැනි සේවා යෝජකයාගේ ව්‍යාපාරය අවසන් වී ඇත්නම් හෝ බංකොලොත් වූ විට හෝ කිසියම් හේතුවක් නිසා බංකොලොත් බව ප්‍රකාශ කළහොත් සහ/හෝ සේවායෝජකයාට එවැනි ගෙවීමක් කිරීමට නොහැකි වූ විට, කාඩ්පත් සාමාජිකයා බැංකුව සම්පූර්ණයෙන්ම සෑහීමකට පත්වන අයුරින් සියලු ගෙවීම් පියවීම සඳහා පුද්ගලිකව වගකිව යුතුය.

25.10 ප්‍රකාශය නොලැබීම කාඩ්පත් සාමාජිකයා විසින් නියමිත වේලාවට ගාස්තු නොගෙවීම සඳහා ප්‍රමාණවත් හේතුවක් ලෙස නොසැලකේ. කිසියම් හේතුවක් නිසා ප්‍රකාශය නොලැබුණහොත්, 30.3 වගන්තියේ දක්වා ඇති ආකාරයට ඔහුගේ/ඇයගේ නවතම ශේෂය සහ/හෝ ප්‍රකාශයේ අනුපිටපත ඉල්ලා සිටීම පිණිස බැංකුව හා සම්බන්ධ වීමටත් අදාළ සියලු ගාස්තුවල එකතුව බැංකුව වෙත ගෙවීමටත් මූලික කාඩ්පත් සාමාජිකයා භාර ගනී.

25.11 ගෙවීම සිදු වන්නේ බැංකුවට ගෙවීම ලැබුණු විට සහ එය කාඩ්පත් ගිණුමට බැර කළ විට මිස කාඩ්පත් සාමාජිකයා එම මුදල යැවූ විට නොවේ. ඕනෑම මුදල් තැන්පතුවක් කාඩ්පත් ගිණුමට බැර කිරීමෙන් පසු පමණක් බැංකුවට එය ලැබුණු ලෙස සැලකිය හැකිය. චෙක්පත නිෂ්කාශනය කර බැංකුවට ලැබෙන මුදල් කාඩ්පත් ගිණුමට බැර කරන තුරු චෙක්පත් තැන්පතුවක් ගෙවීමක් ලෙස නොසැලකේ.

25.12 ගෙවිය යුතු දිනට කාඩ්පත් සාමාජිකයාගේ හිඟ කාඩ්පත් බිල්පත් මුදලින් ප්‍රතිශතයක් කාඩ්පත් ගිණුමට ගෙවීමට කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුවේ කාඩ්පත් සාමාජිකයාගේ නමින් ඇති ජංගම හෝ ඉතුරුම් ගිණුමට සෘජු හර කිරීමේ ස්ථාවර උපදෙස් නිකුත් කළ හැකිය.

25.13 එවැනි ස්ථාවර උපදෙස් සඳහා කිසියම් සංශෝධනයක් සහ අවලංගු කිරීමක් වෙතොත් මීළඟ ගෙවීම් නියමිත දිනට අවම වශයෙන් සති දෙකකට පෙර බැංකුව වෙත දැනුම් දිය යුතු බවට කාඩ්පත් සාමාජිකයා එකඟ වේ.

25.14 බැංකුවේ පියවීම් ගිණුමකට සෘජු හර ස්ථාවර උපදෙස් සඳහා, පහත අමතර නියමයන් සහ කොන්දේසි අදාළ වේ.

a) ඉදිරිපත් කරන ලද චෙක්පත් හෝ බැංකුව සමඟ කරන ලද වෙනත් විධිවිධානවලට එරෙහිව එවැනි ස්ථාවර උපදෙස්වල ප්‍රමුඛතාවය තීරණය කිරීමට බැංකුවට අයිතියක් ඇති බවට කාඩ්පත් සාමාජිකයා එකඟ වන අතර,

b) ගෙවීම් කිරීමට නියමිත දිනට පෙර දින ස්ථාවර උපදෙස් සපුරාලීම සඳහා නම් කරන ලද පියවීම් ගිණුමට ප්‍රමාණවත් අරමුදල් සැපයීමට කාඩ්පත් සාමාජිකයා එකඟ වේ.

පියවීම් ගිණුමේ ප්‍රමාණවත් ශේෂයක් නොමැති අවස්ථාවක, ස්ථාවර උපදෙස් අනුව ගෙවීමේ මුදල ආවරණය කිරීම සඳහා බැංකුව විසින් එහි අභිමතය පරිදි වරින් වර අයිරා ප්‍රදානය කළ හැකිය. බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන අනුපාතයකට, ඒ මත උපචිත මූල්‍ය ගාස්තු සමඟ සියලුම හිඟ මුදල් ඉල්ලුම මත ආපසු ගෙවීමට කාඩ්පත් සාමාජිකයා බැඳී සිටී.

25.15 කාඩ්පත් සාමාජිකයාට කාඩ්පත නිකුත් කරන විට එවැනි චෙක්පතක් හෝ මුදල් ඇපයක් ඉල්ලා නොසිටියද බැංකුවට අවශ්‍ය විය හැකි මුදල සඳහා කාඩ්පත් සාමාජිකයා විසින් දින නියම නොකළ චෙක්පතක් සහ/හෝ බැංකුවට මුදල් ඇපයක් තැන්පත් කරන ලෙස බැංකුව ඕනෑම අවස්ථාවක ඉල්ලා සිටිය හැක. කාඩ්පත් සාමාජිකයා, එවැනි අවස්ථාවක, එම චෙක්පතෙහි දිනය ඇතුළත් කිරීමට සහ බැංකුවට ගෙවිය යුතු ඕනෑම මුදලකට ඇතුළු කළ දිනයේ ගෙවීම සඳහා එය ඉදිරිපත් කිරීමට බැංකුවට බලය පවරා ඇති බව සලකනු ලැබේ.

25.16 කාඩ්පත් සාමාජිකයා විසින් ගෙවිය යුතු මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් හෝ නියමිත දිනට පෙර ගෙවීමට අපොහොසත් වුවහොත් හෝ කාඩ්පත් සාමාජිකයා භුක්ති විඳින මූල්‍ය/ණය/වෙනත් පහසුකමක් සඳහා බැංකුව සමඟ ඇති ඕනෑම ගිවිසුමක් යටතේ වෙනත් කිසියම් පැහැර හැරීමක් සිදු කළහොත්, එවැනි අවස්ථාවක, බැංකුවට එක් එක් ගිවිසුම හෝ මෙම ගිවිසුම යටතේ එහි නිශ්චිත අයිතියකට අගතියකින් තොරව, මෙම ගිවිසුමේ දක්වා ඇති සියළුම හෝ කිසියම් අයිතියක් බැංකුවේ අභිමතය පරිදි ක්‍රියාත්මක කිරීමට බැංකුවට හිමිකම් ඇති බව කාඩ්පත් සාමාජිකයා පැහැදිලිවම පිළිගනී.

25.17 ඕනෑම කාඩ්පත් සාමාජිකයෙකුගෙන් හිඟ මුදල් එකතු කිරීම සඳහා එහි බලයලත් එකතු කිරීමේ නියෝජිතායතනයට ගෙවිය යුතු මුදල් පැවරීමේ අයිතිය බැංකුව රඳවා තබා ගන්නා අතර එසේ කිරීමේදී දරන ලද වියදම් කාඩ්පත් සාමාජික ගිණුමට අය කිරීමට බැංකුවට අයිතියක් ඇත.

25.18 කාඩ්පත් සාමාජිකයා විසින් හෝ වෙනුවෙන් ඉදිරිපත් කරන ලද කිසියම් ගෙවීම් උපකරණයක් පිළි නොගන්නේ නම්, කාඩ්පත් සාමාජිකයාට එරෙහිව නීත්‍යානුකූලව පියවර ගැනීමට බැංකුවට අයිතියක් ඇති අතර එහි අභිමතය පරිදි දණ්ඩ ගාස්තු අය කිරීම සහ/හෝ කාඩ්පත් ගිණුම අවලංගු කිරීම සිදු කරනු ඇත.

25.19 මෙම ගිවිසුමේ අනෙකුත් විධිවිධානවලට අගතියකින් තොරව, මූලික කාඩ්පත් සාමාජිකයා සහ/හෝ අතිරේක කාඩ්පත් සාමාජිකයා මාසයකට වැඩි කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටියහොත්, මූලික කාඩ්පත් සාමාජිකයා කාඩ්පත් ගිණුම පියවීම සඳහා පැහැදිලි සහ නිශ්චිත උපදෙස් ලබා දිය යුතු අතර එවැනි උපදෙස් පිළිබඳව මූලික කාඩ්පත් සාමාජිකයාගේ සහ/ හෝ අතිරේක කාඩ්පත් සාමාජිකයාගේ විදේශගත වීමට පෙර, බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය දැනුවත් කළ යුතුය.

## 26. කඩ කිරීම:

යම් කාඩ්පත සාමාජිකයකු විසින් මේ ගිවිසුම කඩ කිරීමේ දී - (අ) මෙම ගිවිසුමේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන් වුවද එවැනි කඩ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සෘජුවම හෝ අන්‍යාකාරයකින් බැංකුවට සිදුවන යම් පාඩුවක් සඳහා කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුව හානිපූරණය කරනු ලැබේ. (ආ) ඉල්ලීම් කරන අවස්ථාවේදී මෙම මුදල් ගෙවිය යුතුද නැද්ද යන්න නොසලකා, ඉල්ලීම මත කිසියම් හිඟ මුදලක් බැංකුව වෙත ගෙවීම සඳහා කාඩ්පත් සාමාජිකයා වගකිව යුතුය.

## 27. අවසන් කිරීම:

27.1 මූලික කාඩ්පත් සාමාජිකයා ඕනෑම අවස්ථාවක, කාඩ්පත් ගිණුම අවසන් කිරීමට (ඕනෑම අතිරේක කාඩ්පතක් (කාඩ්පත්) ඇතුළුව) ලිඛිතව හෝ පහත 30.3 වගන්තියේ සඳහන් ආකාරයට බැංකුව ඇමතීමෙන් ඉල්ලා සිටිය හැක. කෙසේ වෙතත්, මූලික කාඩ්පත් සාමාජිකයා කාඩ්පත් ගිණුම අවසන් කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට පෙර කාඩ්පත් ගිණුමේ මුළු හිඟ මුදල (ඕනෑම අතිරේක කාඩ්පතක් (ඕනෑම අතිරේක කාඩ්පතක්) ඇතුළුව) සම්පූර්ණයෙන් පියවා ඇති බවට සහතික විය යුතුය. කාඩ්පත් ගිණුමේ කිසියම් බැර ශේෂයක් තිබේ නම් (ඕනෑම අතිරේක කාඩ්පතක් (කාඩ්පත්) ඇතුළුව), එය ආපසු ගෙවන ආකාරය පිළිබඳව මූලික කාඩ්පත් සාමාජිකයා බැංකුවට ලිඛිත උපදෙස් සැපයිය යුතු අතර, එසේ නොකළහොත් කිසියම් බැර ශේෂයක් බැංකුව විසින් අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

27.2 කාඩ්පත් ගිණුම අවසන් කරන ලෙස මූලික කාඩ්පත් සාමාජිකයා බැංකුවෙන් ඉල්ලා සිටින විට, කාඩ්පත් සාමාජිකයන් විසින් චුම්බක තීරුව කපා ඇති බවත් කාඩ්පත කාඩ්පත් සාමාජිකයා (සාමාජිකයන්) විසින්

ආරක්ෂිතව විනාශ කර ඇති බවත් සහතික කර ගනිමින් ඔවුන්ගේ අදාළ කාඩ්පත කොටස් හතරකට කපා වෙන් කළ යුතුය.

27.3 කලින් සඳහන් කළ තත්වයන්වල දී හැර, මූලික කාඩ්පත් සාමාජිකයා හෝ අතිරේක කාඩ්පත් සාමාජිකයන් විසින් කිසිදු කාඩ්පතක් හෝ කාඩ්පතක් ගිණුමක් අවසන් නොකළ හැකිය.

**27.4** කාඩ්පත් සාමාජිකයා විසින් කාඩ්පත විනාශ කල බව සඳහන් කිරීමෙන් පසු කාඩ්පත මත ගනුදෙනු සිදු කළහොත් එම ගාස්තු කාඩ්පත අනිසි ලෙස භාවිත කිරීම නිසා ඇතිවුවද එසේ නැතිවුවද නැතහොත් බැංකුවට දැනුම් දී ඇති වුවද නැති වුවද එම ගාස්තු සඳහා කාඩ්පත් සාමාජිකයා සම්පූර්ණයෙන්ම වගකිව යුතු ය.

27.5 බැංකුවේ අභිමතය පරිදි අවශ්‍ය වන තත්ත්වයන් පිළිබඳව දැනුම් දීමක් ඇතිව බැංකුව විසින් ඕනෑම අවස්ථාවක කාඩ්පත අවසන් කළ හැකිය. කාඩ්පත කාඩ්පත අවසන් කිරීමේදී බැංකුව හා කාඩ්පත් සාමාජිකයා අතර වෙනත් ආකාරයකින් යෝජනා කරන ලද පෙර ගිවිසුම් තිබුණද: i) කාඩ්පත් සාමාජිකයා (සාමාජිකයන්) විසින් කාඩ්පත භාවිතා කිරීමේ අයිතිය වහාම නතර වනු ඇත; ii) ප්‍රකාශයේ දැනටමත් සඳහන් වී ඇතත් නැතත්, පසුව ගෙවිය යුතු සියලුම ගාස්තුවල එකතුව මෙන්ම අවසන් කිරීමෙන් පසු දරනු ලබන ගාස්තු ප්‍රමාණය (අදාළ ගනුදෙනුව සඳහා උපදෙස් දුන් දින සිට ක්‍රියාත්මක වන පරිදි), සාමාජික (සාමාජිකයන්) වහාම ගෙවිය යුතු අතර අදාළ වන පරිදි ඒ සඳහා පොලී එකතු වනු ඇත, iii) කාඩ්පත් ගිණුම අවසන් කිරීම බලාත්මක වූ පසු, සමුච්චිත ත්‍යාග ලකුණු ස්වයංක්‍රීයව අවලංගු වේ.

27.6 මෙම ගිවිසුම අවසන් වීම හෝ කාඩ්පත් සාමාජිකයාගේ බංකොලොත් භාවය හෝ මරණය මත කාඩ්පත් ගිණුමේ සම්පූර්ණ හිඟ ශේෂය සහ ගනුදෙනුව සිදුකර ඇති නමුත් තවමත් කාඩ්පත් ගිණුමට අය කර නොමැති ඕනෑම හිඟ කාඩ්පත් ගනුදෙනු මුදලක් වහාම සම්පූර්ණයෙන් බැංකුව වෙත ගෙවිය යුතුය. කාඩ්පත් සාමාජිකයා හෝ ඔහුගේ බූදලය කාඩ්පත් ගිණුමේ යම් හිඟයක් පියවීමට වගකියනු ලබන අතර, එම හිඟ මුදල් අයකර ගැනීමේදී දරන ලද සියලුම වියදම්, ගාස්තු (නීති ගාස්තු ඇතුළුව) සහ වියදම්වලට එරෙහිව බැංකුවට හානිපූරණය කළ යුතු අතර එවැනි ආපසු ගෙවීමක් සිදු කරනතෙක්, පවතින අනුපාතය (අනුපාත) අනුව මූල්‍ය ගාස්තු සහ අනෙකුත් ගාස්තු සහ ගාස්තු අය කිරීමට බැංකුවට හිමිකම් ලැබේ.

27.7 බැංකුව හෝ කාඩ්පත් සාමාජිකයා විසින් මෙම ගිවිසුම අවසන් කිරීම නොතකා, කාඩ්පත භාවිතා කිරීම මගින් දරනු ලබන සියලුම ගාස්තු සඳහා කාඩ්පත් සාමාජිකයා දිගටම වගකිව යුතුය.

27.8 ඉහත 27. 1 වගන්තිය ප්‍රකාරව මූලික කාඩ්පත් සාමාජිකයා කාඩ්පත් ගිණුම අවසන් කිරීමට බලාපොරොත්තු වන විට, මූලික කාඩ්පත් සාමාජිකයා විසින් එවැනි අවසන් කිරීමක් ඉල්ලා සිටීමට පෙර සමුච්චිත ප්‍රසාද (රිවෝඩ්) ලකුණු ලබා ගත යුතු අතර, එසේ නොකළහොත් කාඩ්පත් ගිණුම අවසන්වීම බලාත්මක වූ පසු එම ප්‍රසාද ලකුණු ස්වයංක්‍රීයව අවලංගු වේ.

**28. සංශෝධන:**

**28.1** කලින් කල මේ ගිවිසුමේ නියම (එකතු කිරීම් වෙනස් කිරීම් සංශෝධනය කිරීම් ආදේශ කිරීම් හෝ කපා හැරීම් අයිතිය ඇතුළු) සංශෝධනය කිරීම් අයිතිය බැංකුව තබා ගනී. පහත 30 වගන්තිය ප්‍රකාරව මූලික කාඩ්පත් සාමාජිකයාට එවැනි සංශෝධන/ සංශෝධනයන් පිළිබඳ දැනුම් දීමක් කළ හැක.

28.2 එවැනි සංශෝධන බලාත්මක වූ පසුව කාඩ්පත් සාමාජිකයා කාඩ්පත තබා ගැනීම හෝ භාවිත කිරීම දිගටම කරගෙන යන්නේ නම්, කාඩ්පත් සාමාජිකයා ගිවිසුමේ වෙනස්කම් පිළිගෙන ඇති බව සලකා බැලීමට බැංකුවට අයිතියක් ඇත. කාඩ්පත් සාමාජිකයා එවැනි සංශෝධන පිළිගැනීමට අකමැති නම්, ඉහත 27 වැනි වගන්තියේ දක්වා ඇති විධිවිධානවලට (අවසන් කිරීම) අනුකූලව මූලික කාඩ්පත් සාමාජිකයා මෙම ගිවිසුම අවසන් කළ යුතුය. එවැනි අවසන් කිරීමට පෙර කරන ලද සියලුම ගාස්තු සහ අයකිරීම් ගෙවා දැමීම සඳහා කාඩ්පත් සාමාජිකයා වගකීම දරයි.

## 29. අනතුරු හැඟවීමේ බුලටිනය (Warning Bulletins)

කිසිදු හේතුවක් නොදක්වා, අනතුරු ඇඟවීමේ නිවේදනයේ කාඩ්පත සඳහන් කර ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි දී කාඩ්පත පරිග්‍රහණය කරන මෙන් සේවා ආයතනයට දැනුම් දීමට බැංකුවට අයිතිය සහ අභිමතය ඇත.

## 30. දැන්වීම්:

30.1 මෙම ගිවිසුම යටතේ ඕනෑම දැන්වීමක්, (එහි යම් සංශෝධන ඇතුළුව) සහ කාඩ්පත් ගිණුමට අදාළ ඕනෑම දැනුම්දීමක් මූලික කාඩ්පත් සාමාජිකයාට (ලිපියකින් සහ/හෝ විද්‍යුත් සන්නිවේදන නාලිකා හරහා, බැංකුවේ ආයතනික වෙබ් අඩවිය (www.nationstrust.com), www.americanexpress.lk සහ/හෝ සන්නිවේදනයේ ස්වභාවය මත බැංකුව විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් ආකාරයකින් ලිඛිතව කාඩ්පත් හිමියා වෙත ලිඛිතව දැනුම් දිය යුතු වන්නේය. කාඩ්පත් ගිණුම් ප්‍රකාශයට අදාළ ඕනෑම තොරතුරක් හෝ දැනුම්දීමක් හෝ එම ප්‍රකාශයේ කොටසක් මෙම ගිවිසුම යටතේ දැනුම් දීමක් ලෙස සැලකිය යුතු වන්නේය.

30.2 ඉහත සඳහන් ආකාරයෙන් සපයනු ලබන නිවේදන පහත පරිදි බලාත්මක විය යුතුය:

- තැපෑලෙන් එවන්නේ නම්, තැපැල් කිරීමෙන් දින පහකට (05) පසු;

- ඊමේල්, කෙටි පණිවුඩ සේවාව ("SMS") සහ/හෝ වෙනත් විද්‍යුත් ආකාරයකින් යවනු ලැබුවහොත් සම්ප්‍රේෂණය වීමත් සමඟ (බැංකුව වෙත එම පණිවිඩය යැවීම අසාර්ථක වූ බවට පණිවිඩයක් ලැබුණ හොත්, එය වෙනත් ආකාරයකින් සන්නිවේදනය කරනු ලැබේ); සහ

- දිනපතා පුවත්පත්වල ප්‍රසිද්ධ නිවේදන ලෙස, බැංකු ශාඛාවල, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවල හෝ බැංකුවේ ආයතනික වෙබ් අඩවියේ (www.nationstrust.com) www.americanexpress.lk හෝ වෙනත් ආකාරයකින් පළ කර ඇත්නම්, ප්‍රකාශනය කරන විට හෝ පළ කරන අවස්ථාවේදී, හෝ බැංකුව සන්නිවේදනයේ සඳහන් කරන වෙනත් වේලාවක;

ඉහත සඳහන් කළ ආකාරයෙන් යවන ලද දැන්වීම ප්‍රමාණවත් සහ නිසි දැනුම්දීමක් ලෙස සලකනු ලබන අතර කාඩ්පත් සාමාජිකයා ( සාමාජිකයන්) එපරිදි කටයුතු කිරීමට බැඳී සිටී.

30.3 කාඩ්පත් සාමාජිකයාගේ නම, සම්බන්ධතා තොරතුරු (එනම් තැපැල් ලිපිනය, ජංගම දුරකථන අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය, බැංකුවේ ලියාපදිංචි වී ඇති වෙනත් තොරතුරු) සහ/හෝ කාඩ්පත් ගිණුම අවලංගු කිරීමට කරන ඕනෑම ඉල්ලීමක් ඇතුළුව බැංකුව වෙත කරනු ලබන ලිඛිත දැනුම්දීමක්, ප්‍රමාදයකින් තොරව, මූලික කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුවට, තැපෑලෙන්, විද්‍යුත් තැපෑලෙන්, බැංකුවේ ඩිජිටල් නාලිකා භාවිතයෙන් හෝ මූලික කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුවේ ලියාපදිංචි ජංගම දුරකථන අංකය හරහා කාඩ්පතේ පිටුපස මුද්‍රණය කර ඇති පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංකය ඇමතීමෙන් සන්නිවේදනය කළ යුතුය. විද්‍යුත් තැපෑලෙන් හෝ ජංගම දුරකථනයෙන් සන්නිවේදනය කරන විට, බැංකුව පිළිගනු ලබන්නේ මූලික කාඩ්පත් සාමාජිකයාගේ ලියාපදිංචි විද්‍යුත් තැපැල් ලිපිනය හෝ ලියාපදිංචි ජංගම දුරකථන අංකය (අදාළ පරිදි) හරහා සන්නිවේදනය කරන ලද දැනුම්දීමක් පමණි. බැංකුව වෙත එවන ඕනෑම දැනුම්දීමක් සම්බන්ධයෙන් බැංකුවේ එවකට පවතින සේවා ප්‍රමිතීන්ට අනුව ක්‍රියා කරනු ඇත.

කාඩ්පත් සාමාජිකයෙකු යාවත්කාලීන සම්බන්ධතා තොරතුරු බැංකුවට ලබා නොදෙන්නේ නම්, දැන්වීම් නොලැබීමෙන් පැන නගින ඕනෑම අලාභයක් කාඩ්පත් සාමාජිකයා විසින් දරා ගත යුතු වේ. බැංකුවට අවසන් වරට දැනුම් දුන් ලිපිනයට/සම්බන්ධතා තොරතුරු මගින් කාඩ්පත් සාමාජිකයා තවදුරටත් සම්බන්ධ කර ගත නොහැකි බව බැංකුව සාධාරණ ලෙස විශ්වාස කරන්නේ නම් බැංකුව විසින් දැන්වීම් යැවීම අත්හිටුවීමට හෝ නැවැත්වීමට හැකිය. එවැනි අවස්ථාවක, කාඩ්පත් සාමාජිකයා විසින් මෙම නියමයන් සහ කොන්දේසි යටතේ දැනුම්දීමේ සියලු අවශ්‍යතා අත්හැර දමයි.

30.4 බැංකුව විසින් වෙනත් ආකාරයක් දැනුම් දෙන්නේ නම් මිස, මූලික කාඩ්පත් සාමාජිකයා වෙත බැංකුව වෙත කිසියම් දැනුම්දීමක් පහත සඳහන් ලිපිනයන්ට යැවිය යුතු වේ:

**තැපෑල මගින්:** නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී
ඇමරිකන් එක්ස්ප්‍රස් කාඩ් මධ්‍යස්ථානය,
256, ශ්‍රීමත් රාමනාදන් මාවත,
කොළඹ 15.
**විද්‍යුත් තැපෑල මගින්:** americanexpress@nationstrust.com

## 31. බලාත්මක කිරීමේ වියදම්:

සම්පූර්ණ හානි පූර්ණ පදනමක් මත නීතිඥ ගාස්තු සහ වෙනත් වියදම් ඇතුළු මෙම කොන්දේසි හා නියමයන් බලාත්මක කිරීමේ දී හෝ බලාත්මක කිරීමට උත්සාහ කිරීමේ දී බැංකුව විසින් දරන ලද සියලු වියදම් සම්බන්ධයෙන් මූලික කාඩ්පත් සාමාජිකයා සහ එක් එක් පරිපූරක කාඩ්පත් සාමාජිකයා බැංකුව හානි පූර්ණය කිරීමට ඒකාබද්ධව සහ තනිව වගකිව යුතුය.

## 32. අතිරේක කාඩ්පත්:

බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන නියමයන් සහ කොන්දේසි මත මූලික කාඩ්පත් සාමාජිකයාගේ පවුලේ සාමාජිකයින්ට අතිරේක කාඩ්පතක පහසුකම බැංකුව විසින් තම අභිමතය පරිදි ලබා දිය හැක. කාඩ්පත් ගිණුමේ ඕනෑම අතිරේක කාඩ්පත් සාමාජිකයෙකු සහ එය නිකුත් කිරීමට බලය පවරන මූලික කාඩ්පත් සාමාජිකයා කාඩ්පත (කාඩ්පත්) භාවිත කිරීම මගින් දරනු ලබන සියලුම ගාස්තු සඳහා ඒකාබද්ධව සහ තනි තනිව වගකිව යුතුය. අතිරේක කාඩ්පතක පහසුකම මූලික කාඩ්පත් සාමාජිකයාගේ අඛණ්ඩ පැවැත්ම මත රඳා පවතී.

## 33. ගෙවීම් අයදුම් කර ගැනීම:

කාඩ්පත් හිමියාගෙන් හෝ වෙනුවෙන් බැංකුවට ලැබෙන සියලු සහ ඕනෑම ගෙවීමක්, කාඩ්පත් හිමියා හෝ ගෙවීම කරන අය විසින් විශේෂ උපදෙස් ලබා දී තිබුණ ද , බැංකුව වඩාත් සුදුසු යැයි සලකනු ලබන ආකාරයකින් සහ අනුපිළිවෙලකින් අයදුම් කර ගනු ඇත.

## 34. දුරකථන, අන්තර්ජාල සහ විද්‍යුත් තැපෑල උපදෙස් සඳහා බලය ලබා දීම සහ හානිපූරණය:

34.1 කාඩ්පත් සාමාජිකයා විසින් හෝ ඔහු/ඇය වෙනුවෙන් දුරකථන, අන්තර්ජාලය, හෝ විද්‍යුත් තැපෑලෙන් ලබා දෙන ඕනෑම දැනුම්දීමක්, උපදෙස්, ඉල්ලීමක් හෝ වෙනත් සන්නිවේදනයක් මත විශ්වාසය තැබීමට සහ බැංකුවේ පාර්ශවයෙන් කිසිදු විමසීමකින් තොරව, ඉහත සඳහන් කර ඇති සාකල්‍යතාවට අගතියක් නොවන පරිදි, උපදෙස් දෙන හෝ ලබා දීමට අදහස් කරන පුද්ගලයාගේ අධිකාරිය හෝ අනන්‍යතාවය සහ එම අවස්ථාවේ පැවති තත්වයන් නොසලකා උපදෙස් ලැබීමෙන් ඒ අනුව අනුව ක්‍රියා කිරීමට කාඩ්පත් සාමාජිකයා බැංකුවට බලය පවරයි. උපදෙස් ලැබුණු වේලාව/දිනය පිළිබඳව බැංකුවේ තීන්දුව අවසන් තීන්දුව ලෙස කාඩ්පතු හිමියා එකඟ වෙයි.

34.2 ගනුදෙනුවේ ස්වභාවය හෝ විධිවිධානය හෝ ඊට සම්බන්ධ මුදල් ප්‍රමාණය කුමක් වුවත් සහ උපදෙස්වල නියමවල කිසියම් දෝෂයක්, අපැහැදිලි බවක්, වරදවා වටහාගැනීමක් හෝ පැහැදිලි බවක් නොතිබුණද ලබා දෙනු ලබන උපදෙස් මුදල් ගෙවීමට හෝ වෙනත් ආකාරයකින් ඕනෑම ගිණුමක් හර කිරීමට හෝ බැර කිරීමට හෝ කිසියම් මුදලක් හෝ ලියකියවිලි බැහැර කිරීමට සම්බන්ද, නැතහොත් කාඩ්පත් සාමාජිකයා බැංකුව සමඟ හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු සමඟ කිසියම් ගිවිසුමකට හෝ වෙනත් විධිවිධානයකට බැඳීමට අදහස් කරන්නේද යන්න හෝ කාඩ්පත් සාමාජිකයා ලබා දෙන වෙනත් ඕනෑම ආකාරයක ගනුදෙනුවක් හෝ විධිවිධානයක උපදෙසක් වුවත් කාඩ්පත් සාමාජිකයා විසින් ලබා දෙන උපදෙස් සම්පූර්ණයෙන් බලය පවරන

ලද සහ බැඳී සිටින උපදෙස් සැලකීමට බැංකුවට හිමිකම් ඇති අතර උපදෙස් සම්බන්ධව හෝ ඒවා මත යැපෙමින් බැංකුව විසින් සුදුසු යැයි සලකනු ලබන එවැනි පියවර ගැනීමට බැංකුවට හිමිකම් ඇත.

34.3 මෙම බලය ලබා දීමේ සහ හානිපූරණ නියමයන්ට අනුකූලව බැංකුව ක්‍රියා කිරීම සැලකිල්ලට ගනිමින්, බැංකුව හානිපූරණය කිරීමට සහ උපදෙස් නිසා හෝ ඊට අදාළව පැන නගින බැංකුව විසින් දරනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන ඕනෑම ස්වභාවයක සහ කුමන ලෙස පැන නගින සියලුම පාඩු, හිමිකම්, ක්‍රියාවන්, ක්‍රියාදාමයන්, ඉල්ලීම්, හානි, පිරිවැය සහ වියදම් වලට එරෙහිව බැංකුව හානිපූරණය කිරීමට කාඩ්පත් සාමාජිකයා මෙයින් අනහෝසිකර ලෙස එකඟ වෙයි.

34.4 මෙම බලය ලබා දීමේ සහ හානිපූරණ නියමයන් කාඩ්පත් සාමාජිකයාගෙන් අවසන් කිරීම පිළිබඳ දැනුම්දීම බැංකුවට ලැබෙන තුරු සහ ඒ අනුව ක්‍රියා කිරීමට සාධාරණ කාලයක් තිබෙන තෙක් සම්පූර්ණ බලාත්මකව පවතිනු ඇති අතර මෙම බලය ලබා දීමේ සහ හානිපූරණ නියමයන් යටතේ, එවැනි කාලය අවසන් වීමට පෙර සිදු කරන ලද ඕනෑම ක්‍රියාවක් සම්බන්ධයෙන්, එවැනි අවසන් කිරීමක් මගින් කාඩ්පත් සාමාජිකයා කිසිදු වගකීමකින් නිදහස් කරනු නොලැබේ..

## 35.විවිධ:

35.1 කාඩ්පත් සාමාජිකයා සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා ඔහුගේ සේවායෝජකයා හෝ වෙනත් ඕනෑම මූලාශ්‍රයක් සම්බන්ධ කර ගැනීමට කාඩ්පත් සාමාජිකයා මෙයින් බැංකුවට බලය පවරයි. කාඩ්පත් සාමාජිකයා වෙනුවෙන් බිල්පතක් මත ගෙවිය යුතු ගෙවීම් කාඩ්පත් සාමාජිකයාට දුරකථනයෙන් මතක් කිරීමට හෝ කාඩ්පත් සාමාජිකයා වෙනුවෙන් දුරකථන ඇමතුම ලබන පුද්ගලයාට මතක් කිරීමේ පණිවිඩයක් යැවීමට බැංකුවට හිමිකම් ඇති බවට කාඩ්පත් සාමාජිකයා එකඟ වේ. ලිඛිතව හෝ වෙනත් ආකාරයකින් කාඩ්පතට ගෙවිය යුතු හිඟ මුදල් පිළිබඳව කාඩ්පත් සාමාජිකයාට මතක් කිරීමට බැංකුව කිසිදු බැඳීමක් නොපවතිනු ඇති අතර ඉහත සඳහන් කළ විකල්පය සහ අයිතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව බැංකුව වෙතින් ප්‍රශ්න නොකළ යුතුය.

35.2 කාඩ්පත් සාමාජිකයා විසින් තම කාඩ්පතේ ඇති හිඟ ශේෂයකට එරෙහිව ඔහුගේ වත්කම්/මුදල් හිලව් කර ගැනීම සඳහා තම සමාගමට හෝ බැංකුකරුට සම්බන්ධ වීමට සහ ඒ සම්බන්ධයෙන් බැංකුව සුදුසු යැයි හැගෙන සියලුම ක්‍රියා, කාර්යයන් සහ දේවල් කිරීමට මෙයින් අනහෝසිකර ලෙස කැමැත්ත පළ කර බැංකුවට අවසර දෙයි. මෙම 35.2 වගන්තිය මෙම ගිවිසුම අවසන් වීමෙන් පසුව ද නොනැසී පවතිනු ඇත.

35.3 බැංකුවේ කිසිදු ක්‍රියාවකින් හෝ චර්යාවකින් හෝ එම අයිතීන් ක්‍රියාත්මක කිරීමේදී නොසලකා හැරීමකින් හෝ ප්‍රමාදයකින් බැංකුවේ කිසිදු අයිතිවාසිකමක් අත්හරින ලද බවක් නොසැලකිය යුතු අතර, බැංකුව විසින් ලිඛිතව නිදහස් කරන තෙක් සෑම අයිතියක්ම පූර්ණ බලාත්මකව සහ බලපැවැත්වෙනු ඇත.

35.4 කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුව තෝරා ගන්නා තුන්වන පාර්ශ්වයකට කාඩ්පත් සාමාජිකයා විසින් ගෙවිය යුතු කිසියම් හිඟ ශේෂයක් හෝ ණයක් විකිණීමට, මාරු කිරීමට හෝ පැවරීමට බැංකුවට පූර්ණ බලයක් සහ අයිතියක් ඇති බව කාඩ්පත් සාමාජිකයා එකඟ වන අතර පිළිගනී. බැංකුව මෙය කිරීමට තීරණය කරන්නේ නම්, ඔවුන් කාඩ්පත් සාමාජිකයාට ලිඛිතව දැනුම් දෙනු ඇති අතර, කාඩ්පත් සාමාජිකයා මෙම ක්‍රියාව පිළිගත යුතුය. කාඩ්පත් සාමාජිකයාගේ කාඩ්පත් ගිණුමට මේ වෙනුවෙන් ඕනෑම වියදමක් අය කිරීමට කාඩ්පත් සාමාජිකයා කැමැත්ත පළ කර බැංකුවට බලය පවරයි.

35.5 කාඩ්පත් ගිණුමේ බැර ශේෂයක් තිබේ නම්, බැංකුවේ පාර්ශ්වයෙන් ඒ සඳහා කිසිදු පොලී ගෙවීමට බැඳීමක් ඇති නොවන බව කාඩ්පත් සාමාජිකයා දැනගත යුතුය.

35.6 මූලික කාඩ්පත් සාමාජිකයාට ඔහුගේ/ඇයගේ කාඩ්පත් සාමාජිකත්වය අනුව ලබා ගත හැකි පක්ෂපාතිත්ව ( Loyalty) වැඩසටහන් තිබේ නම්, එවැනි වැඩසටහන් සඳහා අදාළ විය හැකි වෙනම නියමයන් සහ කොන්දේසි මගින් පාලනය වේ. කෙසේ වෙතත්, කාඩ්පත් ගිණුම හරහා යම් ගෙවීමක් දින අනූවක් (90) ඉක්මවා ඇත්නම් හෝ මුදල් නොගෙවීමෙන් කාඩ්පත් ගිණුම පැහැර හරිනු ලැබුවහොත්, කාඩ්පත් ගිණුම හරහා එකතු වී ඇති ත්‍යාග ලකුණු ස්වයංක්‍රීයව අවලංගු වේ.

35.7. එවැනි සේවා ආයතන තම වෙළඳ භාණ්ඩ හෝ සේවාව සම්බන්ධයෙන් වට්ටම් ලබා දෙන විට හෝ මිල අඩුකළ විට සේවා ආයතන විසින් කාඩ්පත භාර නොගැනීමට ඉඩ ඇත.

**36. නීතිය හා අධිකරණ බලය:**

මෙම ගිවිසුම ශ්‍රී ලංකාවේ නීති මගින් පාලනය වන අතර ඊට අනුකූලව තේරුම් ගත යුතු ය. ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින් නිකුත් කරන ලද රජයේ නියෝග අනුව හෝ උපදෙස් අනුව යම් සංශෝධනයක් අවශ්‍ය නම් මෙම ගිවිසුම ස්වයංක්‍රීයව සංශෝධනය වනු ඇත. මෙම කාඩ්පත සහ කාඩ්පත් ගිණුම භාවිත කළ හැකි වනුයේ වලංගු හා නීත්‍යානුකූල කාර්ය සඳහා පමණි. වෙනත් යම් කාර්යයක් සඳහා කාඩ්පත් සාමාජිකයා විසින් කාඩ්පත භාවිත කළහොත් හෝ වෙනත් තැනැත්තෙකුට කාඩ්පත භාවිත කිරීමට අවසර ලබා දුනහොත් එම භාවිතය සම්බන්ධයෙන් කාඩ්පතේ සාමාජිකයා වගකිව යුතු වන අතර එවැනි භාවිතයක ප්‍රතිඵලයක් ලෙස දරන ලද සියලු පාඩු/වියදම් කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුවට සහ ඇමෙරිකන් එක්ස්ප්‍රස් සමාගමට ප්‍රතිපූර්ණය කළ යුතු ය.

**37. පැවරීමේ කොන්දේසි:**

බැංකුව විසින් වත්මනෙහි සහ අනාගතයේ ඕනෑම අවස්ථාවක මේ ගිවිසුම සම්පූර්ණයෙන් හෝ එහි යම් කොටසක් ඇමෙරිකන් එක්ස්ප්‍රස් සමාගමට හෝ එහි අනුබද්ධිත සමාගම්වලට හෝ නම් කරන්නන්ට (ඕනෑම "ඇමරිකන් එක්ස්ප්‍රස් ආයතනයක්") පැවරීමට කාඩ්පත් සාමාජිකයා මෙයින් කැමත්ත ප්‍රකාශ කරන අතර බැංකුව විසින් හෝ "ඇමරිකන් එක්ස්ප්‍රස් ආයතනයක්'' විසින් කාඩ්පත් සාමාජිකයාට දෙන ලද පැවරුම පිළිබඳ දැන්වීම් සඳහන් දිනයේ සිට මෙම ගිවිසුම බලාත්මක වේ.